# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2559 නිකිණි මස 29 වන ශනි දින ■ 2015 අගෝස්තු මස 29 වැනි සෙනසුරාදා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ

# මොහොතක සුවයකට සසර ගමනේ අතරමං වෙනවාද?

මනස විශ්වයේ ඇති විශාලම හාස්කමයි. තමන්ට සිතෙන්නේ කුමක්ද? එය ඉටු කළ යුතුමද? එය ඉටුකළ නොකළහොත් තමාට අයත් වන්නේ කුසලයක්ද? අකුසලයක්ද?

මෙම ප්‍රශ්න පෙළ යම් දෙයක් සිතූ පමණින් කිරීමට පෙර තම හදවතින්ම විමසුවහොත් තමා අතින් සිදුවීමට තිබූ වැරැද්දක් මගහරවා ගැනීමට හෝ තමා අතින් සිදුවිය යුතු දේ ඒ අයුරින් වඩාත් නිවැරදිව කිරීමට හැකියාව ලැබෙනු ඇත.

අද සමාජයේ බොහෝ මිනිසුන්ගේ මනස ඔවුනොවුන් විසින් පාලනය නොකර සාමාජීය වටපිටාවට පාලනය කිරීමට ඉඩ ලබාදී තිබෙන්නේ ඔවුන්ටවත් නොදැනීමය. එයින් තමාට සිදුවන්නේ අවැඩක් පමණක් බව තේරුම් ගන්නේ කරදරයට පත්වූ පසුවය. අපටම අයිති අපේම සිත කුමන කරුණක් නිසාද අන් සංස්කාරයන්ගේ පාලනයට නතු කරන්නේ? තමාට හැකි නම් තමාගේ සිත තමාටම නතු කරගෙන කුසලයෙහි පිහිටුවා ක්‍රියා කරන්න එයයි තමා ලබන මානසික සුවය. පාලනය කර නොගත් අශීලාචාර සිත කසල බඳුනක් හා සමානය. ''මනස'' යන වචනය කසල කරත්තවල පවා තද අකුරින් ලියා තිබීමේ අරුත තමන් විසින් සිතා බැලුවාද?

''අන්තෝ ජටා බහි ජටා - ජටාය ජයිතා පජා
තං තං ගෝතම පුච්ඡාමි - කො ඉමං විජටයෙ ජටා''

(ඇතුළතද අවුල්ය, පිටතද අවුල්ය, මිනිසුන් අවුලෙන් අවුලටම පත්වී තිබේ. මේ අවුල ලිහන්නේ කවුද ගෞතමයාණන් වහන්ස, ඔබගෙන් ප්‍රශ්න කරමි.)

යනුවෙන් දෙවියන් බුදුරජාණන් වහන්සේගෙන් විමසුවේ දෙවියන්ටද මිනිසුන්ගේ මනස විසින් සිදුකරන ක්‍රියා කලාපය තේරුම් ගත නොහැකි වූ නිසා විය හැක. අශීලාචාර සිත ශීලාචාර කරගන්න. කය වචනය සංවර වූ කලී සිතද ඉබේටම සංවර වනු ඇත. තමා විසින් මනස නිවැරදිව හසුරුවන්න. බෞද්ධ ග්‍රන්ථ, ධර්ම දේශනා, භාවනා මගින් මනස ඒකාග්‍ර කරගන්න. කුසල් වඩන්න. පංචේන්ද්‍රයන් තුළින් ලබාගන්නා සීමිත පරාසයට කොටු වූ ආශ්වාදය මගින් ''මෙයයි ජීවිතය'' යැයි දකින ඥානයෙන් පිරිහුණු හුදෙක් ජනයා අතරට තමන්ද අයත් වන්නේ දැයි සිතීමට කාලයයි මේ.


**සකුණ රඹුක්වැල්ල**
**ධර්මරාජ විද්‍යාලය, මහනුවර**






# නූතන ගිහි ගෙදර පිරිහෙන්නේ මේ නිසා

## අලුතින්ම සොයාගත් කරුණු

- නිරුවත දිස්වන ලෙස ඇඳීම, පහත් හැඟීම් ඇතිවන ලෙස ඇඳුම් පැළඳුම් ඇඳීමට ඇති කැමැත්ත.
- කෑම බීම සැකසීමට දක්ෂතාව තිබියදී රසවත් ආහාර පාන තම දරුවන්ට සකසා නොදීම.
- අනාගතය ගැන නොසිතා ඉතුරු නොකොට ලෝකයාට පෙනෙන ලෙස නාස්තිකාර වියදම් කිරීම.
- නිතර මස් මාංශ අනුභව කිරීමට ඇති කැමැත්ත හා ගෙදර නිතර මස් මාංශ සකස් කිරීම.
- මංගල මුද්ද උකස් තැබීම, බඩු උකස් තැබීම.
- ගෙදර සියලු දෙනා දන්නා දුරකථන අංකයට පරිබාහිරව හොර රහසේ භාවිතා කරන දුරකථන අංක තිබීම හා ඒවා භාවිතා කිරීම.
- ආගමික වතාවත් දිනවලදී ආගමික ස්ථානවලට නොගොස් නිකරුණේ කාලය ගත කිරීම, ආගමික ස්ථානවලට ගියත් ආගමික වතාවත් ඉටු නොකිරීම.
- ආගමික ස්ථානවලට යනවාට වඩා විනෝදාත්මක ස්ථානවලට යාමට ඇති කැමැත්ත.
- නිතර සාද පැවැත්වීම හා ඒවා සඳහා ආරාධනා කිරීම.
- පයින් ගිය හැකි ගමන් වාහනවලින් යාම.
- පාසලට, උපකාරක පන්තියට යාමට දරුවන් උනන්දු කරන ආකාරයට දහම් පාසලට යාමට උනන්දු නොකිරීම.
- ආගමික ස්ථානවලට නොගැළපෙන ඇඳුම් ඇඳීම, පාවහන් පැළඳ එම භූමි මතින් ගමන් කිරීම, හිස් වැසුම් පාවහන් පැළඳ එම ස්ථානවල කටයුතු කිරීම.
- රසකාරක යෙදූ ආහාරපාන අනුභවයට ඇති කැමැත්ත.
- පිරිසිදු ජලය පානයට වඩා පැණි බීම පානයට ඇති කැමැත්ත.
- තමන් ජීවත් වන පරිසරයේ මල් පැල වගා කළත් එළවළු භෝග වගා නොකිරීම.
- ගෙදරින් බැහැර කරන අපද්‍රව්‍ය පරිසරය දූෂණය වන පරිදි තැන් තැන්වල දැමීම.
- දත් මැද්දත් දිව නොමැදීම, මූණ සේදුවත් නාසය නොසේදීම, ඇඟ සේදුවත් ඉකිලි කිහිලි නොසේදීම, ඔලුව සේදුවත් දෙකන් නොසේදීම.
- කුස්සිය, නාන කාමරය, නාන ස්ථාන, යට ඇඳුම් පවිත්‍ර ලෙස හා අලංකාර ලෙස තබා නොගැනීම.
- රූපවාහිනිය, පරිගණකය, අන්තර්ජාලය, දුරකථනය කළමනාකරණයකින් තොරව පරිහරණය කිරීම.
- දොර ජනෙල්, විදුලි බුබුළු, ජල කරාම, නිවසේ නිසි ලෙස නඩත්තු නොකිරීම.
- වැඩිපුර නිදාගැනීම, කකුල් උඩ තබාගෙන ඇනුම් ඇරීම, අනුන්ගේ දොස් නිතර සෙවීම.
- තමන් නිදාගත් ඇඳ සකස් නොකිරීම, තමන් භාවිතයට ගත් පිඟාන, කෝප්පය සෝදා තැබීමට නොහැකි බව.


**පූජ්‍ය කඹුරුපිටියේ මුනින්දවංශ හිමි**


මේ ලෝකයේ කවරදාවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්.



# අටලෝ දහමට අනුගත වෙන්න

බුදු දහම, කිතුණු දහම, හින්දු දහම, මුස්ලිම් දහම සහ තවත් නොයෙක් ධර්මයන් තුළින් ප්‍රධානව සිදුවනුයේ ශිෂ්ට සම්පන්න, ගුණගරුක මිනිසකු නිර්මාණය කිරීමයි.

ගෞතම බුදුන් වහන්සේගේ දහම යනු සොබාදහමේ ක්‍රියාකාරිත්වයේ යථාර්ථයත්, එහි ප්‍රතිඵලයත් ගුරු උපදේශයකින් තොරව අවබෝධ කරගැනීමයි. එහි එක් ක්‍රියාවකි හේතුඵලවාදය නොහොත් පටිච්ච සමුප්පාදය. සෑම ක්‍රියාවකටම ප්‍රතිඵලයක් තිබේ. යහපත් ක්‍රියාවන්හි යහපත් ඵලයක්ද, අයහපත් ක්‍රියාවන්හිදී අයහපත් ප්‍රතිඵලයන්ද ලැබෙන බවයි. මිනිසා යනු සිත සහ කයේ එකතුවකි. කය යනු ඉන්ද්‍රිය සමූහයකින් ගොඩනැගුණු භෞතික දෙයකි. මෙහිදී මිනිසා සහ තිරිසනා අතර ඇති වෙනස නම් තිරිසන් සත්වයාට සිත පාලනය, එසේ නොමැති නම් දමනය කළ නොහැක. නමුත් මනස උසස් මිනිසා එය කළ හැකිය. එසේම මේ සිත නොහොත් විඤ්ඤාණය දමනය කර දියුණු කරගතහොත් මිනිසාට බොහෝ විශ්මිත දේ කළ හැක.

එසේම කර්මය යනු ක්‍රියාවයි. එය ප්‍රධානව කොටස් දෙකකි. කුසල කර්ම සහ අකුසල කර්ම යනුය. යමෙකු යහපත් මනසකින් යහපත් ක්‍රියාවක් කරයිද එහි ප්‍රතිඵලය තමා අත නොහැර යන, සෙවණැල්ල මෙන් සැප විපාක ගෙන දෙයි. එසේම අයහපත් මනසකින් (දුෂ්ට මනසකින්) යම් ක්‍රියාවක් කරයිද එහි ප්‍රතිඵලය ගොනු පසුපස යන කරත්ත රෝදය මෙන් තමා පසුපස හඹා එයි. මෙය සොබාදහමේ න්‍යායකි. එය බුදුන් වහන්සේ අවබෝධ කළ සේක. තමන් කරන හොඳ හෝ නරක ක්‍රියාවන් කවුරුන් දැනුවත්ව හෝ නොදැනුවත්ව කළත් එහි ප්‍රතිඵලය අනිවාර්යයෙන්ම උඩ දැමූ දෙයක් බිම පතිත වන්නාක් මෙන් තමන් කරා ඒ.

අප මේ ගමන් කරන්නේ අනවරාර්ග සංසාර ගමනකි. එහි එක් නවාතැන් පළකි මෙය. අප හට මතු භවයක් ඇත. එය සුගතිගාමී කරගැනීමට නම් මේ භවයේ කුසල ක්‍රියාවන්හි යෙදෙමින් අර්ථවත් දේ කළ යුතුය. තමන් කරනු ලබන සෑම ක්‍රියාවක් තමන්ටත්, සමාජයටත් යහපතක් විය යුතුය.

එසේම යම් පුද්ගලයකු බ්‍රාහ්මණයා වන්නේත්, තවත් පුද්ගලයකු වසලයකු වන්නේත්, ඔහුගේ හෝ ඇයගේ කුලයෙන් නොව ක්‍රියාවෙන් බව බුදුන් වහන්සේ වසල සූත්‍රයේදී දේශනා කළහ.


කර්මයේ විපාක බුදු, පසේ බුදු, මහ රහතන් වහන්සේලා වෙත පවා පැමිණෙන ධර්මතාවකි. එසේ නම් පුහුදුන් අප ගැන කුමක් කියමුද? පෙර කර්මයන්හි හා සොබාදහමේ ප්‍රතිඵලයක් ලෙස මේ ජීවිතයේදී අප වටා කරුණු අටක් ක්‍රියාත්මක වනු ඇත. එනම් ලාභ අලාභ, සැප දුක, යස අයස, නින්දා ප්‍රශංසා යනුවෙනි. මෙම අටලෝ දහම බුදු, පසේ බුදු මහ රහතන් වහන්සේ ඇතුළු පුහුදුන් අපටත් පොදු ධර්මතාවකි. එසේනම් මෙම ධර්මතාවන්ට මුහුණ දෙන්නේ කෙලෙසද? මිනිසා යනු උසස් මනසක් ඇත්තෙකු බව කලින් සඳහන් කළෙමි. එසේ නම් මේ සියල්ලම උපේක්ෂාවෙන් දරා ගැනීමට තරම් අපගේ මනස දියුණු කළ යුතුය. නැතිනම් මේ ධර්මතාවන් ඉදිරියේ (අලාභ, දුක, අයස) අප කායිකවත්, මානසිකවත් පීඩාවන්ට පත්වේ. මේ ලෝකයෙහි මෙම ධර්මතාවන්ට මුහුණ නොදෙන කෙනෙකු නොමැති බව අතුල උපාසක හට බුදුන් වදාළ සේක. "අතුල, මේ ලෝකයේ මිනිසුන් නිශ්ශබ්දව සිටින පුද්ගලයාටද නින්දා කරයි. ප්‍රමාණයට කතා කරන පුද්ගලයාටද නින්දා කරයි. බොහෝ කතා කරන පුද්ගලයාටද නින්දා කරයි. මේ ලෝකය තුළ නින්දා නොලබන කෙනෙක් අතීතයෙහිද, වර්තමානය තුළද නැත. එසේම අනාගතයෙහිද පහළ නොවන්නේය.

එසේ නම් "දළදා වරුණ" පාඨකය, අප විසින් කළ යුතුව ඇත්තේ සිත, කය, වචනය යන තිදොරින් සිදුවන්නා වූ අනර්ථකාරී ක්‍රියාවන්ගෙන් බැහැරව මෙත්තා, කරුණා, මුදිතා ආදී ගුණ ධර්මයන් දියුණු කරගෙන නිරතුරුවම අප වටා සිදුවන්නා වූ අටලෝ දහම අභිමුඛයේ කම්පා නොවී, නොසැලී, අඬා වැළපීමෙන් තොරව සිටීමට තරම් උපේක්ෂාවෙන් යුක්ත වූ සිතක් ඇතිකර ගැනීමට උත්සාහ කිරීමයි.

සුවිනීතා ලියනගේ

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."

# ම් වත්පිළිවෙත්
# රියට කළොත්
# බේ නිවසත්
# සුරවිමනක්




නිවස දිව්‍ය විමානයක් කරගන්නත්, තමන්ගේ ව්‍යාපාර ආයතනය සම්පත් ලබාදෙන තැනක් කරගෙන ජීවත් වීමට සැම මනුෂ්‍යයකුම කැමති වේ. එය ඔබ ජීවත් වටපිටාව පරිසරය තුළම ඔබ විසින්ම නිර්මාණය කරගත බව දන්නවාද? එවැනි වටපිටාවක් සකස් කරගෙන යුතු කිරීමට මෙම ලිපිය ඉතා වැදගත් වේ.

## බුදු පිළිමය ඊශාන දිසාවට

අලංකාර නිවසක් තුළ දුක් කම්කටොලුවලින්, හැඬූ ින් ජීවත් වීමට වඩා එවැනි නිවසක සැනසීමෙන් ජීවත් ) මෙම වත් පිළිවෙත් පිළිපැදීම ඔබට ඉතා වැදගත් වේ. දුෂ්චරිතයෙන් දුරු වී අඹු සැමියන්, දූවා දරුවන් යහපත් ුණුවෙන් දියුණුවට පත්වීමට ඔබට හැකි වේ. සිනාමුසු මුහුණින් රැකියාව නිම කොට නිවසට සැමියෙක්, බිරිඳක් ඔබට ඉදිරි කාලයේ දැකිය හැක. ාපියන්ට කීකරු, දෙමාපියන් කල්‍යාණ මිත්‍රයන් සේ සිතා ුතු කරන දරුවන් ඔබේ නිවසේ දැකීමට හැකිවනු ඇත. ඹු ප්‍රාර්ථනා, අහිමි වූ බොහෝ දේ ඔබට ලැබී යහපත් කික ජීවිතයක් ගත කිරීමට මෙයින් හැකි වේ. විවාහ ) පෙර විවාහයෙන් පසු දුන් පොරොන්දු ඉටුකරන යහපත් සැමියන් ලෙසින් කටයුතු කරන්න ඔබේ සිත යොමු වන ැ බලන්න.

ප්‍රථමයෙන් ඊසාන දිශාවට පිහිටි ලෙස බුදු පිළිමයක් හෝ ුටියක් තනාගන්න. නිවස තුළ හෝ නිවසින් පිටත වුවත් නැත. එහි තැන්පත් කරන බුදු පිළිමය ඊසාන දිශාවට

## දීප්තිමත් පහනක්



ුතුය. මැටි වුවත්, පාෂාණ, ලෝහ ා වර්ග වුවත් එකම පැහැයක ාවක් වීම ඉතා වැදගත් වේ. එම ානයේ තැන්පත් කිරීමට පහත ්න් දේවල් සොයා ගන්න.

ාමන් විසින් සිඳ ගත් පොල් තෙල් බෝතලයක් (තැඹිලි හෝ පොල්)

2. පිරුවානා පොත් වහන්සේ නමක්
3. සැරියුත්, මුගලන්, සීවලී මහරහතන් වහන්සේලාගේ ඡායාරූප හෝ ප්‍රතිමා (එහි තැන්පත් කළ හැකි ප්‍රමාණයේ ඒවා.)
4. තුන් වතාවක් පෙරා ගත් පිරිසිදු පැන් බෝතලයක්. (ප්ලාස්ටික් හෝ හිස් මත්පැන් බෝතල් නොවිය යුතුයි.)
5. තුන්නූල් කරන ලද නූල් පන්දුවක්.

මල්, පහන් පූජා කිරීමට මැටි හෝ සුදුසු බඳුනක් සකස් කරගන්න. එයට ජලය පිරවිය හැකි විය යුතුය. එයට ජලය පුරවා නෙලාගත් මල් ජලය මත පිළිවෙළට තබන්න. සුදු මල් නම් ඉතා යහපත් වේ. ගොඩක් මල් නැති වුවත් මල් පහන් දහයක් (5, 10) වුවත් ප්‍රමාණවත් වේ.

හඳුන්කූරු දැල්වීමෙන් පසු වැටෙන අළු පිටතට නොවැටෙන ලෙස සුදුසු බඳුනක් භාවිත කරන්න. පහන් දෙකක් සකස් කරගන්න. පහන් දැල්ල ඉතා දීප්තිමත්ව ආලෝකය විහිදෙන පහනක් භාවිත කිරීම ඉතා වැදගත් වේ.

## ජලය මත පාවෙන මල්



ලෝකය මෙතරම් දියුණු යුගයක ලංකාවේ අපි තවමත් බුදුන්ට පුදන ආලෝක පූජාව පරණ මැටි පහනය. ලෝකයේ අනෙක් ථෙරවාදී රටවල බුදුන් වෙනුවෙන් ආලෝක පූජාව සඳහා නිපදවා ඇති තෙල් භාවිත කොට දල්වන පහන් දකින විට අපේ බෞද්ධ වත් පිළිවෙත් ගැන අපිටම දුක සිතේ. එම නිසා ඔබේ පහනේ දැල්ල දීප්තිමත් කරගැනීමට සැර විනාකිරිවල පහන් තිරය පොඟවා, වියළා භාවිතයට ගන්න. එයින් පහන් දැල්ලේ ආලෝකය දීප්තිමත් වේ. දුම් කබලක්. ගිනි පෙට්ටිය, එම ස්ථානය පවිත්‍ර කරන උපකරණ එයටම වෙන් කොට තබන්න. එය නිවසේ වෙනත් දේ සඳහා භාවිතයට නොග න්න.

ඉහත කටයුතු නිම කිරීමෙන් පසුව මුළු නිවසම පවිත්‍ර කොට අතුගා පිරිසිදු කරන්න. එය අතරතුර සෙත් පිරිත් පටියක් වාදනය වීමට හරින්න. නිවස පවිත්‍ර කිරීමෙන් පසු ඉතා හොඳින් ශරීරය පවිත්‍ර වන සේ ජලස්නානය හෝ ශරීරය

''පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි.''

පවිත්‍ර කර ගැනීම වැදගත් වේ.

ඉන් පසුව බුදු පිළිමය තැන්පත් කරන ලද ස්ථානය මල්, හඳුන්කූරු, ගිලන්පස ආදිය පූජාවට සකසා ගත් දේ තැන්පත් කරන්න. දුම් කබල දල්වා එය නිවුණු පසු සුවඳ කුඩු යොදා බුදු කුටිය ඇතුළු මුළු නිවසටම දුම් අල්ලන්න. අවසානයේ කුස්සියට හා නාන කාමරයටත් දුම් අල්ලන්න. ඇඳෙන් උඩ හා යට, අහුමුළු

## නිවස පුරා පැතිරෙන සෙත් පිරිත් වාදන

සියල්ලට දුම් අල්ලන්න. ඉන්පසු පහන්, හඳුන්කූරු දල්වා පිරිත් වාදන පටිය නවතා පන්සිල් ගෙන බුද්ධ වන්දනාව කරන්න. පවුලේ සියලු දෙනාම එකතු වී උදේ සවස කළ හැකි නම් ඉතා යහපත් වේ. එයටම කෙනෙකු කැප වී කිරීම හෝ දින බෙදා ගෙන කිරීමටවත් උත්සාහ ගන්න.

බුදු පහනට අමතරව සකස් කරගත් පහන බුද්ධ වන්දනාවෙන් පසුව දල්වා පහත සඳහන් ගාථා තුන් වතාවක් කියමින් පිරිත් කියන්න.

"සබ්බේ සත්ථා සුඛපත්ථා
අවේරා ච අනාමයා
දීඝායුකො අඤ්ඤ මඤ්ඤං
පියා පප්පොන්තු නිබ්බුතිං"

"සබ්බ පාපස්ස අකරණං
කුසලස්ස උපසම්පදා
සචිත්ත පරියෝ දපනං
ඒතං බුද්ධානු සාසනං"

"සබ්බේ බුද්ධා බලප්පත්තා
පච්චේ කානංච යං බලං
අරහංතානං ච තේජේන
චිත්තං පාපේති මුඤ්චතු"

එක ගාථාව තුන්වර බැගින් කියන්න.

ප්‍රාර්ථනාව:

මේ පහන් ආලෝකය තුන්තරා බෝධියට පැමිණ වදාළ සියලු සම්බුදු රජාණන් වහන්සේලාටද පූජා කරමි. පූජා වේවා... පූජා වේව...

එයින් ලැබෙන පින බුද්ධ ශාසනය සුරකින සියලු සම්‍යක් දෘෂ්ටික දේවතාවුන් වහන්සේලාටත් ලැබෙත්වා. තෙරුවන් සරණින් දේව පිහිටත් ලැබ ත්‍රිවිධ බෝධ බුදුබලය හේතු කොටගෙන මටත්, මගේ ගෙදර සැම දෙනාටත් සියලු යහපත, දියුණුව උදාවේවා. සුවපත් වේවා. සියලු වාද භේද දුරුවී සාමය, සමගිය ඇති වේවා. හැමදෙනාගේ සිත, කය නීරෝගි වේවා. ගුණ නුවන දියුණු වේවා. මේ මව්බිමේ සිටින අය මෙන්ම මුහුදින් එපිට විදේශගත වී සිටින පවුලේ සියලු දෙනාගේ සියලු අපල විපත් දුරුවී ආලෝකමත් වේවා. අසත්පුරුෂයෝ දුරුවෙත්වා. කල්‍යාණ මිත්‍රයෝ ඇසුරට ලැබේවා.

## නිවසේත් ඔබේත් පිරිසිදුකම

"සබ්බ බුද්ධානු භාවේන
සබ්බ ධම්මානු භාවේන
සබ්බ සංඝානු භාවේන
සබ්බ දේවානු භාවේන
සදා සොත්ථී භවන්තු මෙ"

බුදු පහනට අමතරව මෙම පහනත් එම ස්ථානයේ තැන්පත් කොට පූජා කරන්න.

මෙලෙස වත් පිළිවෙත් පුරමින් කාලයක් ගතවන විට ඔබේ



යහපත් දිවි පැවැත්ම මෙන්ම ඔබ සතුව පවතින පිරිත් තෙල් හා පිරිත් පැන්ද අධ්‍යාත්මික බලයක් ඇති තෙරුවන් ගුණයෙන් යුක්ත වූ දේ බව සිහි තබාගන්න. යහපත් ලෞකික ජීවිතයක් ගත කරන අධ්‍යාත්මයේ ප්‍රාර්ථනා කුටිය බවට එම ස්ථානය පත්වනු ඇත.

## විශ්වයට මුසුකළ ප්‍රාර්ථනා ගාථා

ඔබ මෙම වත් පිළිවෙත් අවබෝධයෙන් ඉටු කොට රාත්‍රී ආහාර ගෙන කටයුතු නිමවා නින්දට පෙර කුස්සිය තුළ ඇති කසල බඳුන නිවසින් බැහැරව තබන්න. සතුන්ට ඇද දැමිය නොහැකි ලෙස එය නිවසින් පිටත තබන්න තැනක් සකස් කරගන්න. එය නිවසේ භූමියේ ප්‍රේත පාදයට හසුවන සීමාවේ තැබීම යහපත් වේ. නිවසින් බැහැරව කරන කුණු කසල ඉඳුල් අනුන්ගේ ඉඩම්වලට වීසි කිරීම, තැන් තැන්වල දැමීම නොකළ යුතු දෙයකි. නිවසින් බැහැර කරන ද්‍රව්‍ය දිරාපත් වන, දිරාපත් නොවන ද්‍රව්‍ය වෙන්කොට ඒවා බැහැර කළ යුතුය. මෙසේ පරිසරයට හානියක් නොකරන මිනිසුන්ට මහී කාන්තාව පොළවට අධිපති දෙවඟන ආශිර්වාද කරනු ඇත. ඉඳුල් භාජන' කුස්සියේ හෝ කෑම මේසයේ ඉතිරි කොට නින්දට නොයන්න. ඒවා සෝදා පවිත්‍ර කරන්න. මුහුණකට සෝදා යටි පතුල්වල ඇති කුණු සෝදා නිදියහනට වන්න. නින්ද ආරම්භ කිරීමට මත්තෙන් කෙටි වේලාවක් මෛත්‍රී භාවනාව කරන්න.

"නමෝතස්ස" ගාථාව තුන්වරක් හෝ හත්වරක් කියන්න. සුව නින්දක් ඔබට ලැබේ.

රාත්‍රී නින්දට සූදානම් වන ලෞකික අය එයට සුදුසු ලෙස රාත්‍රිය ගත කළ යුතු අතර, ලෝකෝත්තර ජීවිත ගත කරන අය එයට සුදුසු ලෙස රාත්‍රිය ගත කළ යුතු වේ. ලෞකික ජීවිත ලෝකෝත්තර ලෙසත්, ලෝකෝත්තර ජීවිත ලෞකික ලෙසත් සිතා කටයුතු කිරීමෙන් සියල්ල උඩු යටිකුරු වන බව සිහි තබාගන්න.

**පූජ්‍ය කඹුරුපිටියේ මුනින්දවංශ හිමි**

"අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය."



# ඔබට ඔබවත් අයිති නැති කොට මම කියා තව කෙනෙක් ලොව කොයි වෙද?

පඨවි, ආපෝ, තේජෝ, වායෝ ශක්ති ප්‍රභවයන්ගෙන් සමන්විත ලෝකයමද අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ''මම'' ලෝකයේ ප්‍රබලතම බල ව්‍යූහයද? ඇස, කන, නාසය, දිව, මනස හා බැඳි චක්ඛු විඥානය, සෝත විඥානය, ඝාන විඥානය, ජිව්හා විඥානය, කාය විඥානය, මනෝ විඥානය ''මම'' ද? එසේ නැතහොත් මනසේ හෝ කයේ සංයුක්ත වීම ''මම'' ද? එනම් නාම රූප සංයුක්ත වීමයි. මෙහිදී නාම යනු සිතයි. රූප යනු ගතයි. නාම රූප සංයුක්තයේ පදනම තණ්හාවයි. මෙකී සමස්ථයේ ''මම'' කවුද?

මම හුදෙක් රූප, වේදනා, සංඥා, සංඛාරා, විඥාන යන ස්කන්ධ පහ අති සමීප හා සංකීර්ණ ලෙස එකිනෙකට බද්ධ වීමෙන් හෙවත් උපාදාන තත්ත්වයට පත්වීමෙන් නිර්මාණය වූවකි. එනම් පංචා උපාදානස්කන්ධයේ ක්‍රියාකාරී විද්‍යාමානයකි. පංච උපාදානස්කන්ධයේ පදනම තණ්හාවයි. තණ්හාව පදනම් වන්නේ නාම රූප මතයි. නාම රූප නිර්මාණය වී ඇත්තේ කෙසේද? එහි ව්‍යූහය කුමක්ද?

රූපය නිර්මාණය වී ඇත්තේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන ශක්ති ප්‍රපංචා කෙරෙනි. පඨවි ශක්තිය යනු ගත ඇතුළත හෝ පිටත තිබෙන ඝනමය තත්ත්වයේ පවතින දේය. එනම් කෙස්, ලොම්, නිය, සම්, මස්, නහර, ඇට, ඇටමිදුළු, වකුගඩු, හදවත, අක්මාව, දලබුව, බඩදිව, පපුමස, අතුණු හා වෙනත් රළු දේය. ආපෝ ශක්තිය යනු සිරුර අභ්‍යන්තරව හෝ පිටත තිබෙන ද්‍රව්‍යමය දේය. එනම් පිත, සෙම, සැරව, ලේ, ඩහදිය, මේද, කඳුළු, වසා තෙල්, කෙළ, සොටු, සඳමිදුළු, මුත්‍රා ආදී ද්‍රව්‍යමය දේය. තේජෝ ශක්තිය යනු කුමක්ද? ගත ඇතුළත හෝ පිටත ක්‍රියාත්මක වන ශක්ති ප්‍රභේදයන්ය. එනම් ආහාර දිරවීමක්, පැසීමක්, දැවීමක්, තැවීමක් ආදිය මගින් ජනිත වන තාපය, විද්‍යුතය ආදී ශක්තීන්ය. වායෝ ශක්තිය යනු ගත අභ්‍යන්තරව හෝ පිටත තිබෙන වායු හා වායුවලට ආවේණික චලිතය ඇති වායුමය දේය. එනම් ඉහළට පහළට බසින, නගින අතුණු තුළ පවතින අතුණු පිටත පවතින අග පසඟ අනුව හැසිරෙන ආශ්වාස ප්‍රශ්වාස වාතයන්ය.

මේ අනුව පැහැදිලි වන්නේ කායික වෛද්‍ය විද්‍යාවට අනුව දැනුම මත පදනම්ව ගත පිළිබඳ විග්‍රහය තවදුරටත් දියුණු විය යුතු බවයි. ස්ත්‍රීගත හා පුරුෂගත කොපමණ අකාර්ෂණීය, කමණීය, කාමණීය, ප්‍රේමණීය, විචිත්‍රවත් ලෙස පෙණුනද, පවතින අන්තර්ගතය අනුව විමසන විට ''මම'' ඉඳුරාම වෙනස් ස්වභාවයක පවතින බවයි. එනම් විශ්ව චලනයක පවතින තත්ත්වයකි. ජෛවයේ නාමස්කන්ධ යනු කුමක්ද? එනම් සිතයි. නාම ස්කන්ධය සමන්විත වන්නේ වේදනා, සංඥා, සංඛාර, විඥාන යන ස්කන්ධ හතරෙනි. මෙම ස්කන්ධ හතර ක්ෂණයක් පාසා විපර්යාසයට ලක්වේ. මෙම ස්කන්ධයන්ගේ ක්‍රියාවලිය මායාවකි. මෙය චෛතසික සසර ක්‍රියාවලියක් පමණි. නමුත් තණ්හාව නිසා එකට බැඳුණු මේ ස්කන්ද හේතුඵල ඵලහේතු ධර්මතාවලට අනුව සසරේ ක්‍රියාත්මක වේ. මෙම ස්කන්ධ ආශ්‍රිතව තණ්හාව ජනිත වන්නේ සලායතන, ඵස්ස, වේදනා ආදී වශයෙන් බුදු දහමෙහි සඳහන් වන පටිච්චසමුප්පාදයට අනුවයි.

මේ අනුව පැහැදිලි වන්නේ ''මම'' හුදෙක් පංච උපාදානස්කන්ධය මගින් නිර්මාණය කර ඇති සූක්ෂම මායාවක් බවයි. මායාවේ පදනම හිතේ පවතින මතකයන්ය. මෙකී තත්ත්වය මේ මොහොතේ සිට තවත් මොහොතකට සම්ප්‍රේෂණය කරමින් ප්‍රතික්ෂේප කිරීම

''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

අති දුෂ්කර කාර්යයකි.

මම වශයෙන් හඳුන්වන ලෝකයේ භෞතික පදනම කුමක්ද? මෙහිදී රූපස්කන්ධ සෑදී තිබෙන්නේ ඝන, ද්‍රව, වායු යන අවස්ථා තුනෙනි. මෙම අවස්ථා තුන නිරන්තරයෙන්ම චලනය වේ. ශක්තිය උත්පාදනය වේ. විද්‍යාවට අනුව නාමස්කන්ධයේ පදනම කුමක්ද? එනම් ප්ලාස්මාවයි. ප්ලාස්මා අවස්ථා යනු මූලද්‍රව්‍යවල පරමාණු බිඳී යෑමෙන් ජනිත වන අයන, ඉලෙක්ට්‍රෝන, න්‍යෂ්ටි ආදී අණු පරමාණුක අංශුවලින් සමන්විත වන පදාර්ථ අවස්ථාවකි. බුදු දහමේ සඳහන් වන සුඛුම රූප හෙවත් සූක්ෂම රූප අවස්ථාව ප්ලාම අවස්ථා වශයෙන් විද්‍යාඥයෝ හඳුන්වති. මනෝකාය මේ අවස්ථාවලට ගළපයි. දෙවියන්, භූතයන්, අවතාර, හොල්මන් ආදිය ප්ලාස්මා අවස්ථාව ලෙස විද්‍යාඥයෝ ප්‍රකාශ කරයි. රූපස්කන්ධයේ පදනම කුමක්ද? ආකර්ෂණය, විකර්ෂණය හා ස්ථායිකරණය එහි පදනමයි. කිසියම් වස්තු දෙකක් එකිනෙකට ළංවීමේ නැඹුරුව ආකර්ෂණය වීමේ නැඹුරුතාවයි. වස්තු දෙක එකිනෙකින් ඈත් වීමේ නැඹුරුතාව විකර්ෂණය වීමේ නැඹුරුතාවයි. වස්තු දෙක අනිස්ථිර ලෙස බැඳී තිබීමේ නැඹුරුතාව ස්ථායිකරණ නැඹුරුතාවයි. විශ්වයේ සමස්ත ක්‍රියාවලියම ආකර්ෂණය, විකර්ෂණය හා ස්ථායිකරණය මත රඳා පවතී. මේ අනුව පැහැදිලි වන්නේ රූපස්කන්ධය වූ කලී අති සංකීර්ණ භෞතික රසායනික පද්ධතියක් බවයි. රූපස්කන්ධයේ ජෛව ජීව බවට පදනම ලබා දෙන්නේ සංකීර්ණ හා එකිනෙකට සමීපව සම්බන්ධ වන රසායනික ප්‍රතික්‍රියා සමූහයක් මගින් හා ප්‍රතික්‍රියා ආශ්‍රිතව සිදුවන ශක්ති විපර්යාස මගිනි.

වේදනාස්කන්ධයේ පදනම වන්නේ රූපස්කන්ධයේ ඇති සෛල රාශිය විශේෂයෙන්ම සිරුර පුරා පැතිර ඇති ස්නායු පද්ධතිය සහ ස්නායු මාංශ පේශී පද්ධතියයි. මේවා මගින් ජනිත වන වේදනා නිසා ඇසින් දකින රූප, කනින් අසන ශබ්ද, නාසයෙන් දැනෙන ගඳ සුවඳ, දිවෙන් දැනෙන රස, කයෙන් දැනෙන ස්පර්ශය, මනසේ ඇතිවන අදහස්, සිතුවිලි ආදිය ඇති වේ. මේවා සඳහා ස්නායු මාංශපේෂී සංවේදී වන අතර ප්‍රතිචාර දක්වයි. මෙම සංවේදී හා ප්‍රතිචාර දැක්වීම ඇතිවන්නේ සරල හා සංකීර්ණ භෞත රසායනික හා විද්‍යුත් ක්‍රියාවලි හා ආශ්‍රිතව සිදුවන ශක්ති විපර්යාස මගිනි. වේදනා මූලික වෙමින් සංඥා, සංඛාර, විඥාන තුන ක්‍රියාත්මක වේ.

සංඥා ස්කන්ධ යනු කුමක්ද? ස්නායු සෛලවලින් සෑදී ස්නායු මාර්ග පථය ඔස්සේ ගලා යන අති කුඩා විද්‍යුත් දහරා ශරීරයේ පවතී. මේවා මගින් විද්‍යුත් සංඥා මොළයට ඇතුළු වේ. මෙම අති සූක්ෂම හා සංකීර්ණ විද්‍යුත් සංඥා සමූහය වේදනා ස්කන්ධයයි. මෙම සංඥා



"යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරී මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ."

මගින් තොරතුරු නිවේදනය වේ. විද්‍යුත් දහරා උත්පාදනය වන්නේ ශරීරය තුළ ඇතිවන භෞතික, රසායනික හා විද්‍යුත් රසායනික ක්‍රියාවලි සමීප ශක්ති විපර්යාස නිසාය. සමස්ත සිරුරේ ක්‍රියාකාරිත්වයට හා විපර්යාසවලට, සියලුම මානසික තත්ත්වලට හා වෙනස්වීම්වලටද මෙම තත්ත්වය හේතුකාරක වේ.

සංඛාර ස්කන්ධය යනු කුමක්ද? ශරීරයේ විවිධ අවයව හා සෛලවලින් ජනිත වන විද්‍යුත් සංඥා ස්නායු මාර්ග පථ ඔස්සේ මොළයට පැමිණ විශේෂිත සම්බන්ධතා ඇතිව සමූහ ගත වේ. මේ හේතුවෙන් නියුරෝන ව්‍යූහ සෑදේ. මෙසේ ජනිත වන නියුරෝන ව්‍යූහ තාවකාලික වේ. තාවකාලික ස්ථීරත්වයක් ඇත. මෙම අනිස්ථිර නියුරෝන සෛල සමූහය විද්‍යුත් වශයෙන් අන්තර් ක්‍රියා කරමින් ජනිත වන චිත්තමය දේ සංඛාරයි. මෙම විද්‍යුත් විභව විචලන රටා ඉලෙක්ට්‍රෝන එන්සෙෆැලෝග්‍රෑම් (BBÔ) යන්ත්‍ර මගින් නිරීක්ෂණය කළ හැකිය. නියුරෝනවල විදුත් ක්‍රියාකාරිත්වය අති සංකීර්ණ වේ. අපගේ ශරීරයේ ඉන්ද්‍රියන් මගින් විද්‍යුත් සංඥා නොලැබෙන විටද නියුරෝන ස්වභාවිකව ක්‍රියාත්මක වේ. එය තත්පරයක් 1 සිට 5 (එකේ සිට පහ) දක්වා විද්‍යුත් ස්කන්ධ ජනනය කරයි. විදුත් සංඥා ලැබෙන තත්පරයකට ස්කන්ධ 50 සිට 100 දක්වා ජනිත වේ. ඇතැම් විට කෙටි කාලසීමාවක් තුළදී තත්පරයකට 500 දක්වා සංඛ්‍යාතය ඉහළ යා හැකිය. විඥාන ස්කන්ධයේ පදනම සංඛාර ස්කන්ධයයි. එනම් ශාරීරික අත්දැකීම් හා මානසික සිද්ධීන් මුල්කොටගෙන සංඛාර ස්කන්ධ වශයෙන් මොළය තුළ තැනෙන නියුරෝන අනුකෘතියි. මෙම නියුරෝන අනුකෘති ශීඝ්‍රයෙන් අඩු වැඩි දෝලනය වන විද්‍යුතය මුදාහැරීම නිසා උද්ගත වන සන්තතික සිතුවිලි සමූහයද, ශාරීරික අත්දැකීම, මානසික සිද්ධීන් පිළිබඳ මතකය ආදියේ සමස්ත විඥාන ස්කන්ධයි.


"මම" යන ලෝකයට ඇත්තේ පංච උපාධන ස්කන්ධ පමණි. එනම් ඉතා දැඩිව, ඝනව, තදින් එකට බැඳුණු හෙවත් උපාදාන තත්ත්වයට පත්වුණු රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන යන ස්කන්ධ පහ පමණි. උපාධානයට හේතුව තණ්හාවයි. බටහිර විද්‍යාවට අනුව මෙම ස්කන්ධ පහ එකට බැඳී තිබෙන්නේ විද්‍යුත් ආවරණ හා විද්‍යුත් ස්කන්ධ ගලා යෑම් හේතු කොටගෙනය.


හුදෙක් මම යනු ඇස, කන, නාසය, දිව, ශරීරය හා බැඳී රූප, වේදනා, සංඥා, සංඛාර, විඥාන යන ස්කන්ධ පහ සූක්ෂම හා සංකීර්ණව බැඳුණු තත්ත්වයයි. පංච උපාදානස්කන්ධය බැඳුණු තත්ත්වයි. පංච උපාදානස්කන්ධ්‍ය ආශ්‍රිතව "මම" නිර්මාණය වන්නේ, ගොඩනැගෙන්නේ උග්‍ර චිත්ත සංකීර්ණතා මධ්‍යයේය. මේ අනුව "මම" කියා කෙනෙක් නැති බව ඔබට තේරුම් යනු ඇත. බුද්ධ දර්ශනයට අනුව ඇත්තටම මම කියා කෙනෙක් නැති බැවින් ඔබත් "මමත්වයේ" ඇලී ගැලී නොසිට දහම් මග ඔස්සේ නිවනට ගමන් කරන්න.


**පූජ්‍ය කෙසෙල්පොත මෛත්‍රීරතන හිමි**



"දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී."







# දම් දෙසුමකදී සහ දන් සැකසීමේදී

## සැලකිය යුතු කරුණු

දාන දෙන තැනත්, ධර්ම දේශනාව පවත්වන තැනත්, උඩු වියන් බැඳීම සිරිතකි. වැඩම කරවන භික්ෂූන් වහන්සේලාට සුදු ඇතිරිලි යොදා ආසන පිළියෙළ කළ යුතු අතර උන්වහන්සේලාට අටපිරිකර හෝ පරිෂ්කාර අවශ්‍ය පරිදි සූදානම් කරගත හැකිය. වැඩම කරවන ස්වාමීන් වහන්සේලාගේ පා සේදීමට වතුර භාජනයක්ද පා සෝදන ස්ථානයේ බිමට ගොක් අත්තක් වියා ගැනීමට හැකිනම් එවැන්නක්ද තබා පා පිස දැමීමට පිරිසිදු රෙදි කඩක්ද නිවසට ඇතුළු වන දොරටුව සමීපයේ සූදානම් කළ යුතු වෙයි. ධර්ම දේශනාව පැවැත්වීමට සූදානම් කරන තැන, වේලාව බලාගැනීමට ඔරලෝසුවක්, පැන් වීදුරුවක් තැබීම හොඳය. ස්වාමීන් වහන්සේලාට දානය පිරිනැමීමට අවශ්‍ය භාජන (පිඟන්, කෝප්ප, කැවිලි සහ පලතුරු පිළිගන්වන පිඟන්ද, පඩික්කම්ද) සූදානම් කර තැබිය යුතුවේ. සාංඝික දානයේදී කරඬුව තැන්පත් කිරීමට ඉහළ තැනක් සූදානම් කරගනී. එහිදී කරඬුවට ඉහළින් සුදු වියනක් සකසා තැබිය යුතුය. බුදුන් වහන්සේ වැඩිය හා සමානව කරඬුවට පූජා කටයුතු කිරීම පළමුව සිදුවන බැවින් නිවසේ බුද්ධ පූජාව පළමුව පවත්වයි. ඒ සඳහා දානය සූදානම් කර තැබිය යුතු අතර මල්, පහන්, සුවඳ දුම් පූජා කෙරෙන බැවින් ඒවාද සූදානමින් තැබීම ඉතා හොඳය.

දානය නිරාවරණය කළ පසු මැස්සන් එක්රොක්වීම වැළකීම සඳහා ඉටි පහනක් දල්වීම එහිදී බිම දූවිලි, කුණු නැතිවන ලෙස හොඳින් පිරිසිදු ක්‍ර තැබීම වැදගත් වේ. දානයක් සිදුකළත් ස්වාමීන් වහන්සේලාට ආරාධනා කිරීම සඳහා දැහැත් වට්ටිය සූදානම් කර තැබීම අනිවාර්යය. එසේම පැන් වැඩීම සඳහාද භාජන සූදානම් කර තැබීම හොඳය.

ගරුතර මහා සංඝරත්නය වැඩම කළ පසු පළමුව පන්සිල් සමාදන්ව අනතුරුව දාන වස්තුව සහ අටපිරිකර ඇතුළු සෙසු පිරිකර මහා සංඝරත්නයට සාංඝිකව පවරනු ලැබේ. එනම් ඒ දාන වස්තුව සංඝරත්නය උදෙසා අයිති කර දීමකි. එය දාන වස්තුව සාංඝික කිරීමයි. එහිදී උපසම්පදා හිමිවරුන් සිවු නමක් වැඩ සිටිය යුතු බවට පිළිගැනීමක් වෙයි:

එහෙත් වැඩ සිටින ගෞරවනීය ස්වාමීන් වහන්සේලා කුමන ආකාරයෙන් වුවත් දාන වස්තුව පිරිසිදු චේතනාවෙන් පිදිය යුතුය. උන්වහන්සේලා,

**''ඉමං භික්ඛං භික්ඛු සංඝස්ස දේම''**

යනුවෙන් වාක්‍යය පැවසූ පසු එම දාන වස්තුව අඤ්ඤා කොණ්ඩඤ්ඤා මහ රහතන් වහන්සේ, අග්‍රශ්‍රාවක සැරියුත් මුගලන් මහ රහතන් වහන්සේලාගේ පටන් උතුම් ආර්ය සංඝරත්නය උදෙසා පිදූවක් බවට පත්වෙයි. දානය වැළඳූ පසු අටපිරිකර, කොට්ට, පැදුරු, ඉදල, පිඟාන, කෝප්පය, කොස්ස ආදී පුද පරිෂ්කාරද පූජා කරනු ලැබේ.


**පූජ්‍ය යටමලගල සුමංගල හිමි - කැලණිය**

''තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය.''



ධර්ම දේශනය

# නිති පින් වැඩෙන පින්කම්



දේශකයාණෝ : ශ්‍යාමෝපාලි
මහානිකායේ මල්වතු මහාවිහාර
පාර්ශ්වයේ විංශද්වර්ගික
කාරක සංඝ සභික
**පූජ්‍ය තිබ්බටුවාවේ
ශ්‍රී සිද්ධාර්ථ මේධංකර**
තේවාවහාර නායක
ස්වාමීන්ද්‍රයන් වහන්සේ

"චිරප්පවාසිං පුරිසං - දූරතොසොත්ථිමාගතං
ඤාති මිත්තා සුහජ්ජා ච - අභිනන්දන්ති ආගතං

තථෙව කත පුඤ්ඤම්පි - අස්මා ලොකා පරං ගතං
පුඤ්ඤානි පතිගණ්හන්ති - පියං ඤාති ච ආගතං"

"බොහෝ කාලයක් තිස්සේ සිය නෑදෑයන්ගෙන් වෙන්ව, දුර රටකට ගොස් සිට සුවසේ ආපසු පැමිණි කෙනෙකු දුටු විට නෑදෑයෝ ද, මිත්‍රයෝ ද, හිතවත්තු ද ප්‍රීතියට පත්වෙති. එමෙන් මෙලොවින් පරලොවට ගිය පින් කළ පුද්ගලයා, දුර සිට පැමිණි ඥාතියෙකු මෙන්, ඔහු විසින්ම කළ පින් ඔහුගේම ඉදිරියට පැමිණ පිළිගනිති."

පින්වත්නි,

නිකිණි මස පුන් පොහෝ දිනය ශාසන ඉතිහාසයේ ඉතා වැදගත් පුන් පොහෝ දිනයකි. පෙරවස් සමාදන් වීමට නොහැකි වූ උපසපන් භික්ෂූන් වහන්සේ, පසුවස් සමාදන් වීමේ පුණ්‍ය කටයුත්තෙහි යෙදෙන පොහොය දිනය නිසාත්, සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙමසකට පසු ප්‍රථම ධර්ම සංගායනාව සිදුකෙරුණු දිනය නිසාත්, ආනන්ද මහතෙරුන්වහන්සේ රහත්භාවයට පැමිණ වදාළ පුන් පොහෝ දිනය නිසාත් නිකිණි පුන් පොහෝ දිනය ශාසනික වශයෙන් ඉතා වැදගත්

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."

වේ. මෙම මාසය වස් කාලයට අයත් බැවින් ගිහිපැවිදි සම්බන්ධතාවය වැඩි වශයෙන් සිදුවන මාසයක් ද වේ. බොහෝ විට සෙංකඩගලපුර ඇසළ පෙරහර මංගල්ලය අවසන් වන්නේ මෙම පුන් පොහෝ දිනය මුල් කොට ගෙනය. මෙවන් උතුම් පොහෝ දිනයක දී ඉහත ගාථා පාඨයෙන් කියැවෙන පරිදි පින්කම් කිරීමත්, පින් ඵල දෙන හැටිත් ගැන දැනගැනීම ඉතා වැදගත්ය.

බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර ජේතවනාරාමයෙහි වැඩවසන සමයෙහි එක්තරා දිව්‍යපුත්‍රයෙකු මැදියම් රැයේ පැමිණ, "කෙබඳු පින්කම් කළ අයට දිවා රෑ හැමදා පින් වැඩේ ද? දැහැමි සිල්වත් කවර කෙනෙක්හු ස්වර්ගගාමී වෙත් දැයි" යන ප්‍රශ්න දෙක විමසා සිටියහ. එවිට අප බුදුරජාණන්වහන්සේ, "ආරාම රෝපණය කිරීම, (මල්වතු පළතුරු වතු වගාකිරීම) වන රෝපණය කිරීම, (වනලැහැබ් වැවීම) ඒදඬු පාලම් කරවීම, පින්තාලි, ළිං, පොකුණු ආදිය කරවීම, වාසස්ථාන තනවා දීම යන පස් ආකාර පුණ්‍යකර්මයන් සිදුකරන තැනැත්තා ස්වර්ගගාමී වෙතැයි" දක්වා වදාළ සේක. මෙම පින්කම් නිතර පින් වැඩෙන පින්කම්ය. මාරයා අද අද පැමිණිය හැකි බැවින් අප්‍රමාදව පින් රැස් කරගත යුතුය. කුසල් කිරීමට කම්මැලි නොවිය යුතුය. මගමානවක කථාවෙන් ද පින්කම්හි අනුසස් වටහා ගත හැකි වේ.


මල් මාලා ගොතන මල්කරුවෙකු පරමල් ඉවත ලා සුවඳවත් පිබිදුනු මල් තෝරා මල්මාලා ගොතන්නාක් මෙන්, යහපත් මිනිසුන් නිතරම පින් හා කුසල් රැස්කර ගනිති. නරක සිතුවිලි වලින් මිදෙති. සංවර පිරිසිදු සිත් ඇතිව වෙසෙති. ඔවුහු තමන්ගේ මෙන්ම අනුන්ගේ ද යහපත පිණිස කටයුතු කරති. තමන් තුළ ඇති අලෝභය, අද්වේශය, අමෝහය යන කුසල මූලයන් වඩා ගැනීමට නිති පින්කම්හි යහපත් දැයෙහි යෙදෙති. කුසලයන්, හීන, මධ්‍යම, ප්‍රණීත යැයි තුන් ආකාරය. තෘෂ්ණා වශයෙන් භවබෝගාදිය පිණිස කරන ලද කුසලයන් හීනය. තමාගේ ගැලවීම පිණිස කරන ලද කුසල් මධ්‍යමය. සකල සත්වයන්ගේ විමුක්තිය පිණිස කරන පාරමිතා කුසල ප්‍රණීතය. පින්කම්හි යෙදීමෙන් ප්‍රීතිය, ප්‍රමෝදය, සතුට, සොම්නස මෙන්ම මෙලොව යහපත ද පරලොව යහපත ද සිදුවේ. කුසලයන් සිදුකිරීමෙන් උසස් භවබෝග සම්පත් මෙන්ම සම්බෝධියට හා නිවනට ද පැමිණිය හැකිය. කුසලය, සම්මාදිට්ඨිය, සම්මාවිමුක්තිය මුල්කරගෙන පවතී. කුසලයන්ගෙන් ඇතිවන ප්‍රීති ප්‍රමෝදය, සුඛය, සමාධිය, විමුක්ති ඤාණ දර්ශනය, අර්හත්වය දක්වා හේතු වේ.

බෞද්ධයන්ගේ මූලික අරමුණ නිවන් දැකීමයි. මිනිස් සිතෙහි පහළ වන ලෝභය, ද්වේශය, මෝහය නිවන පිටුදකියි. නිර්වාණය ලබා ගැනීමට නම් අලෝභ, අද්වේශ, අමෝහ යන කුසල් සිතුවිලි වැඩිය යුතුය. ඒ සඳහා මාර්ගයක් ද බුදුරජාණන්වහන්සේ දේශනා කොට වදාළ සේක. ඒ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. යහපත් දැකීම, යහපත් සිතුවිලි, යහපත් කථාව, යහපත් ක්‍රියාව, යහපත් ජීවිකාව, යහපත් වීර්යය, යහපත් සතිය, යහපත් සමාධිය යන අට ඒ ආර්ය අෂ්ටාංගික මාර්ග යයි. සංවර කරගත් පිරිසිදු සිතින්, යහපත් චේතනාවෙන්, ප්‍රඥාවෙන් හා අවබෝධයෙන් මධ්‍යම ප්‍රතිපදාවෙන් ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කළ විට නිවන නැමැති විමුක්ති මාර්ගයට පිවිසිය හැකිය.

නිවනට හේතුකාරක වන පින මෙන්ම කුසල් සපුරා ගැනීම සඳහා යහපත් පිරිසිදු සිතින් කාය වාග් සංවරය ඇතිව ශීල, සමාධි, ප්‍රඥාදිය පිරිය යුතුය. නිවන් මගට හේතුකාරක වන කඨින සිවුරු පූජාව, අටපිරිකර පූජාව, ආවාස ගෙයක් තනවා සඟසතු කොට පූජා කිරීම, සාංඝික දාන පිරිනැමීම, ශාසනයේ චිරස්ථිතිය පිණිස බුද්ධ ධර්මය ලිවීම හා ලියවීම, බුද්ධ පූජා වශයෙන් සඟසතු කොට කෙත්වතු පිදීම, ධාතු චෛත්‍යය, විහාර මන්දිර, මල් ආසන, බෝධි රෝපණය කිරීම, වැසිකිළි කැසිකිළි තනවා සඟසතු කොට පිදීම යනාදී අටමහ කුසල්හි යෙදීමෙන් මෙලොව මෙන්ම පරලොව ද සුගතිය සාදාගත හැකිය. බුද්ධ ධර්මය ලිවීම හා ලියවීම පර්යාප්ති ශාසනයේ චිරස්ථිතිය සඳහා හේතු වේ. විහාර සන්තක දේපළ නිසා පැවිදි ජීවිතය සුරක්ෂිත වේ. පින්කම් තුළින් ලෝභ, ද්වේශ, මෝහ යටපත් කළ හැකිය. එමගින් මෙලොව යහපත පමණක් නොව සසර දුකින් නිදහස් වීමට ද හැකියාව ලැබෙයි.

ප්‍රාණඝාතයෙන් වැළකීම, නොදුන් දෙය සොර සිතින් ගැනීමෙන් වැළකීම, වැරදි කාමසේවනයෙන් වැළකීම, මුසාවාදයෙන් වැළකීම, පිසුනාවාචයෙන් වැළකීම, පරුෂාවාචයෙන් වැළකීම, සම්පප්‍රලාපයන්ගෙන් වැළකීම, අවිජ්ජාවෙන් වැළකීම, ව්‍යාපාදයෙන් වැළකීම, මිච්ඡාදිට්ඨියෙන් වැළකීම යන දස කුසලයන්හි යෙදීමෙන් කුසල් සිත් වැඩේ. අකුසල් සිත් යටපත් වේ.

දානය, ශීලය, භාවනාව, පත්තිදානය, පත්තානුමෝදනාව, වෙය්‍යාවච්චය, අපචායනය, දේශනාව, ධර්මශ්‍රවණය, දෘෂ්ටිය ඍජු කිරීම යන දසපුණ්‍යක්‍රියාවන්හි යෙදීම මෙලොව යහපත පිණිස මෙන්ම පරලොව සුගතිය පිණිස ද හේතු වේ. නොපැකිළිව යම් කිසිවක් අනුන්ට දෙන අවස්ථාවෙහි සිතෙහි පහළවන චේතනාවත්, දෙනු ලබන වස්තුවත් යන දෙක දානයයි. එබඳු දානවස්තු දහයකි. ආහාරය, පානය, නිවාස, වස්ත්‍ර, යානවාහන, මල්ගඳවිළවුන්, සුවඳවර්ග, සයනාසන, පහන් දැල්වීමට උවමනා දැය දීමාදිය දසවිධ දාන වස්තූන්ය. කායවාග් සංවරය, චිත්ත සංවරය ශීලමය පුණ්‍යක්‍රියාය. යම්කිසි භාවනා ක්‍රමයකට යෝග්‍ය වූ අරමුණක සිත පිහිටුවාගෙන වැඩීම භාවනා කුසලයයි. තමන් සිතෙහි උපදවාගත් කුසල චේතනා අන්‍යයන්ට දීම පත්තිදානයයි. අනුන් විසින් කරන ලද කුසලයක් අනුමෝදන් වීම පත්තානුමෝදනාවයි. වැඩිමහල් අයට හා ගුණවතුන්ට උපකාර කිරීම වෙය්‍යාවච්ච දානයයි. වැඩිහිටියන්ට ගරුබුහුමන් කිරීම අපචායනයයි. ලාභාපේක්ෂාවක් නොමැතිව අනුන්ට දහම් දෙසීම දේශනාවයි. ශ්‍රද්ධාවෙන් අනුන් දේශනා කරන ලද ධර්මය ශ්‍රවණය කිරීම ස්‍රැතියයි. කර්මය ඇත, කර්ම විපාක ඇත යනුවෙන් සම්‍යක් දෘෂ්ඨියෙහි ඇද නැති කිරීම දෘෂ්ඨි ඍජු බවයි. මෙකී දසපුණ්‍යක්‍රියා අතර දාන, ශීල, භාවනා ත්‍රිවිධ පුණ්‍යක්‍රියා ලෙසද සැලකේ. ශීලයෙහි පිහිටීම ද පුණ්‍යක්‍රියාවකි. නිති පන්සිල් රැකීම, පොහොය අටසිල් රැකීම, දසසිල් රැකීම පමණක් නොව ඉන් ඉහළ සිල් රැකිය හැකිනම් බොහෝ පින් රැස්කර ගත හැකිය.



ඉහත දැක්වූ ධම්මපදයේ පියවග්ගයේ එන ගාථා පාඨයට අනුව පින් කළ පුද්ගලයා පරලොව ගිය විට, දුර සිට පැමිණි ඥාතියෙකු මෙන් ඔහුගේම පින් ඉදිරියට පැමිණ පිළිගනියි. බුද්ධ දේශනාවට අනුව තමාට පිහිට තමාමය. එබැවින් අනුන්ගේ පිහිට නොපැතිය යුතුය. තම බුද්ධිය හා වීර්යය ඉවහල් කරගෙන සියලු බැඳීම් වලින් නිදහස් වීමේ ශක්තිය ඇත්තේ මිනිසා තුළමය. තමාම පුණ්‍යකර්මයන්හි හා කුසල ධර්මයන්හි හැසිරී සසර දුකින් ගැලවීමට, නිවන ලැබීමට, දුකින් නිදහස් වීමට උත්සාහවත් විය යුතුය. බුදුරජාණන්වහන්සේ සිදුකළේ මාර්ගය පෙන්වා දීමය. එම මාර්ගය පිළිපැද නිවන් මග අවබෝධ කර ගැනීම තමන් විසින්ම සිදුකළ යුතුය. නිවැරැදි දේ පිළිගෙන, එය වටහා ගෙන කුසල් මග වැඩිය යුතුය. සැකයෙන් තොරව සත්‍යාවබෝධය ලබා ආධ්‍යාත්මික දියුණුව සාදා ගැනීම සඳහා නීවරණයන්ගෙන් වැළකිය යුතුය. විචිකිච්ඡාව හෙවත් සැකය සත්‍යාවබෝධයට හා ආධ්‍යාත්මික දියුණුවට බාධාවකි. අවිජ්ජාව, මිච්ඡාදිට්ඨිය පවත්නා තෙක් දියුණුවක් ඇති නොවේ. දියුණුවක් ලැබීමට නම් සැකයෙන් නිදහස් විය යුතුය. සැකයෙන් නිදහස් විය හැක්කේ පැහැදිලි ලෙස දැකීමෙනි. ප්‍රීතිය ප්‍රමෝදය සුඛය නිවන් දැකීමට වැඩිය යුතුම අංගයෝ වෙති. එබැවින් අපිදු නිති පින්කම්හි හා කුසල ධර්මයන්හි හැසිරී සම්මා දිට්ඨිය හා සම්මා විමුක්තිය නැමැති පින් හා කුසලයන් වඩා ගැනීමට දිරිමත් වෙමු.

දළදා සමිඳු පිහිටයි.

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."






# ජය පරාජය
## සමසේ විඳගන්න

නින්දා අපහාස, ජය පරාජ නිරතුරුව අපගේ ජීවිතයට උරුම වන්නකි. එදා සිදුහත් බෝසතුන් අවුරුදු හයක් දුෂ්කර ක්‍රියා කරමින් බුදුවීමට උත්සාහ කළේය. දුෂ්කර ක්‍රියාව තුළින් බුදු බවට පත්විය නොහැකි බව දුන දුෂ්කර ක්‍රියාව අත්හැරියේය. මධ්‍යම ප්‍රතිපදාව අනුගමනය කළේය. නිවැරදි මග එය බව බෝසතුන්ට වැටහුණේය. බුදුවීමට උත්සාහ කරද්දී දස මරසෙන් මාර දූවරු පැමිණ බුදුවීම වැළැක්වීමට උත්සාහ ගත්තේය. එහෙත් බෝසතුන් ඔවුන් පලවා හැර බුදු බවට පත්විය. මේ අනුව පැහැදිලි වන්නේ යහපත් ක්‍රියාවකට උත්සාහ කිරීමේදී විවිධ අවහිර බාධා පැමිණෙන බවයි. පරාජය වූවා යැයි කියා අධෛර්යමත් නොවිය යුතුය. නැවත උත්සාහ කිරීම ජයග්‍රහණය කිරීමේ මාවතයි. යම් ක්‍රියාවකින් ජයගත් පමණින් ඉදිරි ඉලක්ක සියල්ල ජයගත නොහැකිය. ඇතැම් අවස්ථාවල පරාජයට පත්වීමටත්, තවත් විටෙක ජය ලැබීමටත් සිදුවේ.

බුද්ධ උපස්ථායක ආනන්ද තෙරුන්ට බුදුරදුන් ජීවමානව වැඩ සිටින තුරාවට අර්හත් ඵලයට පත්විය නොහැකි විය. නමුත් උත්සාහය අත්නොහැරිය හෙයින් බුදුරදුන් පිරිනිවී තුන් මසකට පසු අර්හත් ඵලය ලබා ගැනීමට හැකිවිය. බුද්ධ කාලයේ සිටි චුල්ලපන්ථක තෙරුන් වසර ගණනක් පාඩම් කළද එක ගාථා පදයක් හෝ පාඩම් කරගැනීමට නොහැකි විය. එනිසා ගුරු හිමියන්ගෙන් දොස් ඇසීමට සිදුවිය. එම උත්සාහය අත්නොහැරි චුල්ලපන්ථක තෙරුන් බුදුරදුන් හමුවට ගොස් ඒ බව බුදුරදුන්ට පවස් බුද්ධ උපදේශ පරිදි ක්‍රියා කිරීමෙන් ගාථා කටපාඩම් කරගැනීමටත්, රහත් ඵලය ලබාගැනීමටත් හැකි විය.

මේ අනුව පැහැදිලි වන්නේ පරාජයේදී අප කිසිවිටකත් අධෛර්යමත් නොවිය යුතු බවයි. විපතක්, පරාජයක් වූ විට ධෛර්යමත්ව ක්‍රියාකිරීම ජයග්‍රහණයට හේතු වේ. බුද්ධ කාලයේ සිටි දේවදත්ත තෙරුන් සමථ භාවනා වඩා පංචාභිඥ අෂ්ට සමාපත්ති ලබාගෙන ඍද්ධියෙන් යාමට හැකියාව ලබාගත් තෙර නමකි. ඉන් උද්දාමයට පත්වූ එම තෙරුන් බුදුන් විනාශ කොට බුදු පදවිය ලබාගැනීමට ක්‍රියා කළේය. අජාසත්ත රජු නොමග යැවීම, සංඝ භේදය ඇති කිරීම, බුදුරදුන්ගේ සිරුරේ ලේ සෙලවීම, දුනුවායන් යෙදීම, රා කළ දහසක් පොවා නාලාගිරි ඇතුන් යෙදීම ආදී නොමනා ක්‍රියාවන් සිදුකිරීම නිසා අවසානයේ තමන්ගේම ශිෂ්‍යයන්ගේ පහර

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

කැමටත්, අවසානයේ නිරයේ උපත ලැබීමටත් හේතු විය.

බුදුරදුන්ගේ දහම නිසි ලෙස වටහා ගත් තැනැත්තා ජයග්‍රහණයේදී අනවශ්‍ය ලෙස උද්දාමයට පත් නොවෙයි. පරාජයේදී ඉවසීමෙන් ක්‍රියා කරයි. පරාජයේදී දුක්වීම, පසුතැවීම අනුවණ ක්‍රියාවකි. පරාජය ජයග්‍රහණය කර නොගෙන පරාජය පත්නරයක් කරගනිමින් තම වැරදි නිවැරදි කරගෙන ජයග්‍රහණයට මාවතක් කරගත යුතුය.

බුදුරදුන් සැමවිටම ජය පරාජය ඉවසාගෙන සම සිතින්, සම මෙතින් ක්‍රියා කළ සේක. බුදුරදුන් දේශනා කළ,

**"ජයං වේරං පසවති**
**දුක්ඛං සේති පරාජිතෝ**
**උපසන්තෝ සුඛං සේතී**
**හිත්වා ජය පරාජයං"**

යන ගාථා ධර්මය අනුව දිනන්නා පරදින්නා තුළ වෛරය ඇති කරවයි. පැරදුණු තැනැත්තා දුකින් වෙසෙයි. උපශාන්ත පුද්ගලයා ජය පරාජය දෙකේදීම සුව සේ වෙසෙයි.

ඒ අනුව පරාජයක් ලැබුණු විගස දුක් නොවී නුවණැති උපශාන්ත පුද්ගලයෙක් සේ ක්‍රියා කළ යුතුය. පරාජය සවියක් කරගත් විට ජයග්‍රහණය ළංකර ගැනීම අපහසු නොවේ. එමනිසා තමාගෙන් මගහැරුණු දේ, අතපසු වූ දේ ගැන සොයා බලා ජයග්‍රහණයට මාවත සොයාගැනීම පුද්ගලයා සතු වගකීමකි.

බුදුරදුන් තුළ පැවැති ජය පරාජය සමව ඉවසීමේ තාදී ගුණය සැම අයකුම ඇති කරගත යුතුය. ලාභ, අලාභ, නින්දා, ප්‍රශංසා, යස, අයස, සැප, දුක් යන අටලෝ දහමින් කම්පා නොවී ක්‍රියා කිරීම උතුම් බුදු පිළිවෙතයි.

බුද්ධ දේශනාව අමතක කොට ක්‍රියා කරන පුද්ගලයා ජයග්‍රහණයේදී උද්දාමයට පත්වී පරාජිතයන්ට නින්දා අපහාස, තර්ජන ගර්ජන කොට කලහකාරී ලෙස හැසිරෙයි. එසේ ක්‍රියා කරන තැනැත්තා අනුවණයෙකි. යම් දිනක තමා පරාජයට පත්වූ විට එබඳු පුද්ගලයන්ට සිදුවනුයේ පසුතැවීමටයි.

**"හන්තා ලභති හන්තාරං**
**ජේතාරං ලභතේ ජයං"**

යන බුද්ධ දේශනාවට අනුව ජයග්‍රහණය කරන තැනැත්තාගේ එම ජයග්‍රහණය උදුරා ගැනීමට පසුපසින් තවකෙකු පැමිණෙන බවයි. එනිසා ජයග්‍රාහකයා ඉතා ප්‍රවේශමෙන් ක්‍රියා කළ යුතුය. තමන්ට යම් ප්‍රමාදයක් වූ සැණින් පසුපස එන්නා තම ජයග්‍රහණය උදුරා ගනු ලබයි. එවිට සිදුවන්නේ මුලින්ම ජය ලබා සිටි තැනැත්තාට දුක් වීමටයි. අද ජය ලබන්නා හෙට පරාජිතයකු විය හැකිය. අද පරාජිතයා හෙට ජයග්‍රාහකයකු විය හැකිය. එනිසා ජයග්‍රහණයේදීත්, පරාජයේදීත් සම සිතින් ඉවසීමෙන්, සුහදත්වයෙන් ක්‍රියා කිරීම ඉතා වැදගත් වේ.

පුද්ගල හැකියාවන් හා දක්ෂතාවන් දිනෙන් දින වෙනස් වේ. ශරීර හා මානසික දුබලතා කවර මොහොතක උද්ගත වේදැයි කිව නොහැකිය. අද දවසේ ජනප්‍රිය වන පුද්ගලයා හෙට දවසේදී ජනතාවට පිළිකුල් පුද්ගලයකුට බවට පත්විය හැකිය. අද ජනතාවට පිළිකුල් වන පුද්ගලයා හෙට ජනප්‍රිය පුද්ගලයකු විය හැකිය. එනිසා පුද්ගල දක්ෂතාව, ගුණධර්ම වර්ධනය කරගන්නා තරමට පුද්ගලයා ජනතාවට සමීප වේ, ප්‍රිය වේ. දක්ෂතා හා ගුණධර්ම තමාගෙන් ඈත් වූ කල්හි ජනතාව තමාගෙන් ඈත් වේ. පරිත්‍යාගය, ප්‍රිය වචනය, සමානාත්මතාව ආදී ගුණාංගයන්ගෙන් හීන පුද්ගලයාට ජනතාවට සමීප වීම අපහසුය.

ජයග්‍රහණය කළ තැනැත්තා පරාජිතයන්ගේ වෛරයට ලක්වේ. ජයග්‍රාහකයාගෙන් පලිගැනීමට පරාජිතයෝ කල්පනා කරති. එනිසා ජයග්‍රාහකයා පරාජිතයන්ගේ දෝෂ දර්ශනයට ලක් නොවී සිටීමට වගබලා ගත යුතුය. පරාජිතයන් සමග සුහදත්වයෙන් ක්‍රියා කළ යුතුය. එමෙන්ම පරාජිතයෝ දුකින් කල් ගෙවති. ජයග්‍රාහකයාගෙන් පලිගැනීමට මාන බලති. එය විපතට හේතු වේ. එනිසා පරාජිතයන් දුක් නොවී නැවත ජයගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරගත යුතුය. එවිට පෙර ජයග්‍රාහකයා පරදවා තමාගේ ජයග්‍රහණය ලබාගැනීම අපහසු නොවේ. ඒ සඳහා හැඟීම්වලට වඩා බුද්ධියට ඉඩ දිය යුතුය.

මනුෂ්‍ය ලෝකයේ ජීවත් වන සියල්ලෝම ජීවත් වනුයේ සීමිත කාලයක් පමණි. මෙහිදී ලබන ජයග්‍රහණය හෝ පරාජය තාවකාලික හා අනිත්‍ය බව මෙනෙහි කළ යුතුය. බුදුරජාණන් වහන්සේ දේශනා කොට ඇති **"සමග්ගා සම්මෝදමානා අවිවදමානා විරෝදකීභූතා අඤ්ඤමඤ්ඤං පියචක්ඛූහි සම්පස්සමානං විහරති"** යන බුද්ධ දේශනාවට අනුව විවාද විවාදවලින් තොරව සමගියෙන්, සතුටු සාමීචියෙන් කිරි දියර මෙන් ඔවුනොවුන් දෙස ප්‍රිය ඇසින් බලමින් සමගියෙන් ජීවත් වන්නේ නම් මනුෂ්‍ය ලෝකයේ ජීවත් වන ජය පරාජ දෙපිරිසම සමගියෙන්, සතුටින්, සැනසීමෙන් ජීවත් වනු ඇත.

**පූජ්‍ය විතාරන්දෙණියේ වජිරවංස හිමි**

# සෙත් කවි කීම සම්බන්ධ සිරිත් විරිත්


සෙත් කවි කීම පිළිබඳව ඇත්තේද දිගු ඉතිහාසයකි. ලාංකේය ජන සමාජයෙහි යම් යම් ආපද අවස්ථාවල දෙවියන් උදෙසා භාර හාර වූ අවස්ථා පවතී. සැළලිහිණි සන්දේශයෙහි උලකුඩය දේවියට දරුවකු ලබාදෙන ලෙස ඉල්ලමින් විභීෂණ දෙවියන්ට යැවූ සන්දේශය "සෙත් කවිය" සිහිපත් කරවයි.

සිංහල බෞද්ධයාට යම් අපලයක්, අතුරු අන්තරාවක්, දුක් ගැනවිල්ලක් ඇතිවූ මොහොතක සෙත් කවියක් කියා ඉන් යම් සහනයක් පැතීම සමාජයේ පවතී. මෙය සැබැවින්ම දේව කන්නලව්වකි. ආගමානුකූල පිළිවෙතක් අනුගමනය කරමින් දේව කන්නලව්ව සිදුකිරීමට ලක් බොදු ජනතාව වගබලා ගනී.

බුලත් අතක්, පලතුරු පස් වර්ගයක්, කැවිලි පස් වර්ගයක් විෂ්ණු දෙවියන්ට කරන කන්නලව්වක් නම් නිල් පැහැ රෙදි යාර දෙකක්ද, කතරගම දෙවියන්ට කරන කන්නලව්වක් නම් රතු පැහැ රෙදි යාර දෙකක්ද ගෙනවිත් පූජා වට්ටියක් සකස් කොට දෙවියන්ට පුද සෙත් කවිය කියනු ලබයි. මෙම කවිය කියනුයේ පන්සලේ ස්වාමීන් වහන්සේය. නැතිනම් කපු මහත්තකු විසිනි.

සෙත් කවිය කීමට විහාරස්ථානයකට පැමිණෙන බැතිමතුන් පළමුව තුණුරුවන් වන්දනාමාන කොට බෝධි පූජාදිය පවත්වා පිරිත් දේශනා කරවාගෙන අනතුරුව දේවාලයට පැමිණ දෙවියන්ට පින් දී කවිය කියනු ලබයි. සෙත් කවිය දින තුනක් හෝ දින හතක් එක දිගට කියන අතර එක කවියක් තුන් වරක් හෝ හත් වරක් කියනු ලැබේ. කවිය කීමට ආරම්භ කරනුයේ පූර පක්ෂයටයි. එනම් පසළොස්වක පොහොය උදාවීමට දින හතක්, අටක් තිබියදීය. කවිය කීමට පෙර දෙවියන්ට පින් දී තම බලාපොරොත්තුව සඵල කර දෙන ලෙස ඉල්ලා සිටින අතර එසේ ඉටුවීමෙන් අනතුරුව විහාරස්ථානයට පැමිණ බෝධි පූජාවක් පවත්වා හෝ දානයක් පිරිනමා එම කුසල ශක්තීන් දෙවියන්ට අනුමෝදන් කිරීමට පොරොන්දු වෙයි.

"සුචරිතයෙහි හැසිරිය යුතුය. දුශ්චරිතයෙහි නොහැසිරිය යුතුය. ධර්මයෙහ් හැසිරෙන්නා මෙලොව පරලොව දෙකෙහිම සුවසේ වෙසේ."




## සැමියෙකුට බිරිඳක් අහිමිවන්නේත් බිරිඳකට සැමියෙකු අහිමිවන්නේත්

# පෙර කළ අකුසල් නිසාද?

අවන්ති රාජ්‍යයේ සිටුවරයාගේ එකම දියණිය "ඉසිදාසි" නම් වූවාය. තිසි වයස්හි එම සිටු පවුල හා සම අන්‍ය සිටු කුලයක තරුණයෙකු සමග සරණ ගියාය.

"ඉසිදාසි" ඉතා කීකරු භාර්යාවකි. ගෙදරද, ස්වාමියාගේද කුඩු මහත් සියලු කටයුතු නොපැකිලව, අනලස්ව කරන්නීය. බිරිඳකගේ කාර්යභාරය මනාව දත් ඇය දාසියක ලෙසින් සියලු කටයුත්තේ නිරත වුවද ස්වාමියාට කෙතරම් ආදරය කළද බිඳකුදු හොඳක් නම් ඔහුගෙන් අසන්නට නොලැබෙයි. ඔහු අතොරක් නැතිව බැණ වදින්නේය. අවසානයේ ඔහු කළේ කුමක්ද? ඉසිදාසි ආපසු ඇයගේ දෙමාපියන්ගේ නිවසට යැවීමය.

ඉසිදාසියගේ දෙමාපියෝ යළිත් වරක් ඇය විවාහ ජීවිතයට ඇතුළත් කළද එහිදී සැමියා ලෙස තම සිටු පවුලට වඩා අඩු මධ්‍යම පන්තියේ සිටු තරුණයෙකු සම්බන්ධ කරගත්තේය. ඉසිදාසිය මෙම ස්වාමි පුරුෂයාටද සැබෑ ආදරයෙන්, උත්සාහයෙන් සියලු කටයුතු කරමින් කීකරුව දාසියක ලෙස පැවතුණද ස්වාමි පුරුෂයාගෙන් කිසිදු හොඳක් නොඅසනුයේ නිතර බැණුම් දෝෂාරෝපණයටම ලක්වූවාය. අවසන පෙර සැමියාගෙන් වූවා සේ ආපසු



දෙමාපියන් වෙතම ඒමට ඇයට සිදුවිය.

මහ පාරේ ඉඳුල් කමින් යන වැරහැලි හැඳි, දුගී හිඟන්නෙකි. ඉසිදාසිගේ පියා ඔහු දකියි. තම තත්ත්වයට අගලු තබන්නටවත් නොහැකි වුවත් කරකියා ගත හැක්කක් නොවූයෙන් ඉසිදාසි මෙම හිඟන්නාට තම සිටුමැදුරම වාසස්ථානය කර දෙයි. තමනට ලැබුණේ සිඟන්නෙකු වුවද ඔහු තම ආදරණීය ස්වාමියා මෙන් රැකබලා ගනිමින්, ඉතා ස්නේහවන්තව, ස්වාමියකු කෙරේ බිරිඳකගේ පැවැත්ම කෙසේද එපරිද්දෙන් කටයුතු කරන්නට විය. පුදුමයක මහත, අසරණ හිඟන්නාටද ඉසිදාසිය එපා විය. යළි සිඟාකමින් ජීවත් වීමට ඉසිදාසිය අත්හැර සිටු මැඳුරින් ගියේය.

ඉසිදාසිය තමන් කෙතරම් හොඳ භාර්යාවක් ලෙසින් පැවතුණද, හැසිරුණද සිය සැමියන්ට එපාවීම ගැන මහත් සේ කලකිරුණාය. මේ නම් මගේ මෙලොව අකුසල කර්මයක් නොවේ. පූර්වයෙහි කරන ලද මහා අකුසල කර්ම විපාකයකි. දිවි නසා ගන්නට අදහස් කළ ඉසිදාසිය පසුව එම අදහස අත්හැර ගිහිගෙයින් නික්මීම මැනවයි අවබෝධ කරගනිමින් මෙහෙණි සස්නේ පැවිදි වූවාය.

බැලුව මැනව... මෙතෙක් දුක් විඳි ඉසිදාසියගේ පුණ්‍ය මහිමය බලවත්ව ඵල දෙන්නට විය. සත් දිනකින් ඉසිදාසිය ත්‍රිවිද්‍යාලාභි රහත් තෙරනමක වූවාය.

ඉසිදාසි රහත් මෙහෙණින් වහන්සේ තමන්ගේ විවාහ ජීවිතය අසාර්ථක වීමට හේතු පැවැසුවාය.

ඉසිදාසි පූර්ව භවයක කරකම්ම නම් නගරයේ මහා ධනවත්, පොහොසත් රන්කරුවෙකි. තරුණ මදය හිසට ගත් ඔහු පරදාර සේවනයේ නිරත විය. මිය පරලොව ගිය ඔහු ඒ පවින් දීර්ඝ කාලයක් නිරාදුක් වින්දේය. පසුව නිරයෙන් මිදී වැඳිරියක කුස පිළිසිඳ ගෙන වඳුරෙකු ලෙසින් බිහි විය. නායක වඳුරා මේ වඳුරාගේ පුරුෂ ලක්ෂණය විනාශ කළේය. මේ පෙර කළ පරදාර සේවනයේ විපාකයකි. පසුව මියගොස් අන්ධ වූ, කුදු වූ එළදෙනකගේ කුසෙහි පිළිසිඳ ගත්තේය. නිසි කල බිහිවුවද එහිදීද බීජහරණයට ලක්විය. පුරුෂ ලක්ෂණය ප්‍රදේශයෙහි පණුවන් ගසා වසර දොළහක් අපමණ දුක් වින්දේය. මේ පරදාර සේවනයේ විපාක ලෙසිනි. පසුකල අන්ධව, දුක් විඳ මියගොස් දාසියකගේ කුසයෙහි උපත ලැබූ අතර එහිදී පෙර පරදාර කර්ම විපාක ලෙසින් නපුංසකයෙක් ලෙසින් විය. තිස් හැවිරිදි කල මියගිය ඔහු ඉතා දිළිඳු දුගී, අසරණ පවුලක දූරියක ලෙසින් උපත ලැබීය.

නිසි කල ඇය සරණ දිවියට යොමු විය. ස්වාමි පුරුෂයා වූයේ ගිරිදාස නම් තරුණයෙකි. ඔහුට තවත් භාර්යාවක් වූවාය. අලුත් දුගී දිළිඳු බිරිඳ මෙම බිරිඳ පිළිබඳ සැමියාගේ සිත බිඳවන්නට කටයුතු කළාය. මේ අකුසල කර්මය මැය පසුපස එළවන්නට විය. තමන් සරණ යන ස්වාමි පුරුෂයාට කොතරම් ආදරය, ස්නේහය, වැඩ කටයුතු කළද ස්වාමි පුරුෂයාගේ සිත ඇය කෙරේ එළඹීමක් සිදු නොවීය. කිසිදු ආදරයක්, කරුණාවක්, ස්වාමි පුරුෂයාගෙන් නොලැබුණේය. ඇණුම් බැණුම් විනා හොඳක් නම් නොවීය. සියලු සැමියන්ට එපාවී ආපසු තමනට පෙරලා ඒමට සිදුවිය. අන්‍ය සැමියන් ගැන කියනුම කවරේද? අසරණ, දුගී, අහිංසක සිඟන්නාට පවා තමන් හා සරණ ආ සිටුකුමරිය එපා විය.

මේ සියල්ල අකුසල කර්ම විපාක වේ. මහණව සත් දිනෙන් රහත් වූයේ කුසල කර්ම ඵල වේ. එහෙයින් කුසලය, අකුසලය මනාව අවබෝධ කරගෙන අකුසල් දුරලා කුසල්හි පිහිටීම කළ යුත්තේය.

(ථෙරිගාථා)

**සිරිපාල මාදුවගේ**

"ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත."

# ඔබත් රාගගින්නෙන් දැවෙනවාද

## නවදලිහේනේ වැඳිරිය ගැන සිතන්න



මිනිස් සිත තරම් සුන්දර වස්තුවක් ලෝකයේ තවම සොයාගෙන නැත. රාගාදී ක්ලේශ ධර්මයන්ගෙන් මිදුණු කල එය ප්‍රභාශ්වරය. ලෝකය හෙවත් ලෞකිකත්වය බිඳී නොවැටී රැකී තිබෙන්නේ අපේ සිත මූලධර්ම තුනකින් ශක්තිමත් ලෙස බැඳී ඇති නිසාය. ලෝබ, දෝස, මෝහ යනු ඒ මූලධර්ම තුනයි.

"යථාගාරං දුච්ඡන්නං - වුට්ඨී න විජ්ඣති
ඒවං අභාවිතං චිත්තං - රාගෝ සමති විජ්ඣති
යථාගාරං සුච්ඡන්නං - වුට්ඨී න සමති විජ්ඣති
ඒවං සුභාවිතං චිත්තං - රාගෝ න සමති විජ්ඣති"

ශාන්තිනායක බුදුපියාණන් වහන්සේ මිනිස් සිත පිළිබඳ දේශනා කොට වදාළ පැහැදිලි විග්‍රහයක් උපමා උපමේය සහිතව ඉහත ගාථාවන්ගෙන් දැකගත හැකිය. සිත උපතින් පිරිසිදු බවත්, ප්‍රභාශ්වර බවත් ජීවත් වීමේ සටනේදී ආගන්තුකව පැමිණෙන ක්ලේශධර්ම නමැති අපද්‍රව්‍යයන්ගෙන් එම සිත අපිරිසිදු වන බව දේශනා කළෝ බුදුපියාණෝය. (පබස්සරමිදං භික්ඛවෙ චිත්තං ආගන්තුකේහි උපක්කිලිට්ඨේහි උපක්කිලිට්ඨං) මෙම මනෝ විග්‍රහය පිළිබඳ විමසුමක යෙදෙන්නට පෙර බුදුපියාණන් වහන්සේ ඒ දහම් පදය දේශනා කිරීමට තුඩු දුන් පසුබිම් කතා පුවත ගැන අපි සොයා බලමු.

ශාක්‍ය වංශික වූ කිඹුල්වත්පුර රාජධානියේ විසූ සිය ඥාති වර්ගයාට නිවන් රස බෙදා දෙන්නට වැඩම කළ ගමනේදී බුදු ඇසට යොමු වූ "පුබ්බේ ච පුඤ්ඤතා" ගුණයෙන් යුතු පුද්ගලයන් අතර නන්ද කුමරුට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. සිදුහත් කුමරු ගිහිගෙය හැර දමා අබිනික්මන් කළ බැවින් රාජ්‍යත්වයේ ස්ථාවර බව වෙනුවෙන් අබිසෙස් ලැබිය යුතුව ඇත්තේ නන්ද කුමරුය. නව මැදුරකට පිවිසීම, විවාහය හා අභිශේකය යන ත්‍රිමංගල්‍යය සඳහා කටයුතු පිළියෙළ වූ රජ ගෙදරට ප්‍රථමයෙන් වැඩම කළේ බුදුරජාණන් වහන්සේය. දන් වළඳා අවසන පාත්‍රය නන්ද කුමරු අතට දී විහාරයට වැඩම කොට තමන් වහන්සේ පසුපස පැමිණි ඒ පුණ්‍යවන්ත සොහොයුරාණන් පැවිදි කළහ.

ලොවුතුරු මගට බට බුද්ධාදී මහ රහතුන් හට ලෞකික ලෝකයේ සකලවිධ සෞන්දර්යතා, මිරිඟුවක පෙනෙන සිසිලක් ලෙස මායා සහගත දෘෂ්ටියක් බව දැණුනත් ගිහිගෙය හැර පැවිදි වීමට තරම් තත්වාවබෝධයක් නන්ද කුමරුට නොවීය.

බුදුහිමි සමග යන නන්ද කුමරු දුටු ජනපද කල්‍යාණිය හෙවත් විවාහ වීමට සිටි කුමරිය අතරමගදී කළ ප්‍රකාශයක්ද ළබැඳි සිතින් වැළඳගෙන සිටි නන්ද කුමරු හදිසියේ ලද පැවිදි බව නොකළ වරදකට ලැබූ දඬුවමක් සේ සිතන්නට විය.

නන්ද හිමියන්ගේ ශාසනික උකටලී බව භික්ෂූන් වහන්සේලා අතර පවා සාකච්ඡාවට ලක්වූ අතර බුදුහිමියන්ටද මේ බව ඇතැමුන් පැමිණිලි කළහ. බුදුරජාණන් වහන්සේ ප්‍රාතිහාර්යාත්මක උපක්‍රමයකින් ජනපද කල්‍යාණිය ගැන මතකය නන්ද හිමියන්ගේ හදවතින් ඉවත් කළ කල්හි දෙව්ලොව ඉපිද දිව්‍ය කුමාරිකාවක් ඇසුරු කිරීමේ අභිප්‍රායෙන් භාවනා කළ බවද සඳහන් වේ.

රාගයෙන් හා කාමච්ඡන්දයෙන් බැඳුණු සිත කෙතරම් චපලද? වහා වෙනස් වන සුළු යැයි අර්ථ දක්වෙන මිනිස් සිත අයාලේ වැඩෙන්නට දීමෙන් ලැබෙන්නේ අහිටු ඵලයකි. සිතක් නම් එය රැකගත යුතුය. කුමකින්ද කෙලෙස් දුහුවිලිවලිනි.

ඉහත ගාථාවන් තුළින් දක්වන්නේ වැඩූ නොවැඩූ දෙසිතක ඇති ගුණාත්මක බව පිළිබඳ තක්සේරුවයි. මැනවින් සෙවිලි නොකළ ගෙය වැස්සෙන් තෙමී යයි. භාවනාවෙන් නොවැඩූ සිතද කෙලෙස් වැස්සෙන් තෙමී දූෂිත වෙයි. භාවනාව ආදී උපාය මාර්ග හා මනෝ ව්‍යායාම මගින් නොවැඩූ සිතක ස්වභාවය වන්නේ රාගාදී හැඟීම්වලට අවනතව ආධ්‍යාත්මික ශක්තීන් සියල්ල දුර්වල කරගැනීමයි. බුදුරජාණන් වහන්සේ නන්ද හිමියන්ගේ චිත්ත ස්වභාවය මැනැවින් දත් සේක. උන්වහන්සේගේ සිත තදින් රාගයටත්, කාමයටත් ඇදී යන්නේ ජනපද කල්‍යාණිය පිළිබඳව සිත තුළ පවතින නොමැකුණු මතකයයි.


දිව්‍යාංගනාවන් හා නවදලිහේනේ දැවී ගිය වැඳිරියකගේ රුව දකින්නට සැලැස්වීමෙන් නන්ද හිමියන්ගේ සිත තුළ පැවැති දැඩි බව ලිහිල්ව යයි. ජනපද කල්‍යාණිය පමණක් අරමුණ වූ සිත දිව්‍යාංගනාවන් හා වැඳිරි රුව අතර ඇති පරතරය මෙන්ම ආශාවන්ගේ අසීමිත බව පිළිබඳ යථාර්ථයක් පසක් කර දෙයි. එමගින් නන්ද හිමියන් පටු සීමාවෙන් ඔබ්බට ගෙන ගොස් පුළුල් අරමුණක තබා කමටහන් ගෙන භාවනා කරයි. "මනා කොට සෙවිලි කළ ගෙයක් වැසි දියෙන් යම් සේ නොතෙමේද" භාවනාවෙන් මනා කොට වැඩූ සිත කාමරාගයන්ගෙන් ආරක්ෂා වන බව දෙවන ගාථා පාඨයෙන් ප්‍රකාශ වෙයි.

සිත පුරුදු පුහුණු කළ හැකි ක්‍රමවේදයන් දෙකක් බුදු දහමේ උගන්වයි. එනම් සමථ භාවනාව හා විදර්ශනා භාවනාවයි. කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීන මිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්චා ආදී කෙලෙස් යටපත් කිරීමට යම් අරමුණක පිහිටා සිත දියුණු කිරීම සමථ භාවනාවයි. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන ත්‍රිලක්ෂණය සිතට ගෙන සිත එහි පුරුදු කොට විදර්ශනා නුවණ ලබාගැනීමට හැකි මග විදර්ශනා භාවනාවයි.

විදර්ශනා භාවනාව නිවන් පිණිස හේතුවන්නා සේම සමථ භාවනාව මගින් සමථයකට පත්කර ගත හැකි කෙලෙස් මත්හේද යළි යළිත් නැගී සිටිනු වළක්වා ගැනීමට මිනිස් සිතට හැකියාව තිබිය යුතුය. සිතට එන එන අරමුණ ඔස්සේ වෙහෙසට පත්වී ඒවා මුදුන් පත් කර ගැනීමට නොහැකිව අසහනයට පත්වනු වෙනුවට අපේ බුදුහාමුදුරුවෝ අපට කියාදී ඇත්තේ සිතට එන කාමරාග මිශ්‍ර කෙලෙස් මල පාලනය කරගන්නා ලෙසටයි. එවිට ඒවා දුරින්ම දුරුකරගැනීමේ හැකියාවද අපට ලැබෙනු ඇත.

**වික්‍රමසිංහ අතපත්තු**

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."



# බෝධි පූජාවක් කළ යුතු නිවැරදි පිළිවෙල



බෝධීන් වහන්සේ වෙත ගොස් පළමුව බෝ මළුව පිරිසිදු කරන්න, මල් ආසනවල ඇති පරවූ මල් ඉවත් කොට ඒවා පිරිසිදු කරන්න. පෙරාගත් පිරිසිදු වතුරට සුදු හඳුන් කුඩු, සැවැන්දරා කුඩු, සමන් පිච්ච මල්, පිනි දිය දමා පැන් කල 7 ක් පිළියෙළ කරගන්න. එම පැන්වලින් ටිකක් බෝ මළුව හා මල් ආසනවලටද ඉසින්න.

ඉන් පසුව බෝ මළුවේ බිම එක පෙළට කව 3 ක් ඇඳ ඒවායේ බුලත් කොළ 21 බැගින් නෙළුම් මලේ හැඩයට තබන්න. බෝ මළුවේ හතර කොණ පොල් මල් දමූ පුන් කලස් 4 ක් තබන්න. එම හතරේ විෂ්ණු, කතරගම, සමන්, විභීෂණ දෙවිවරුන්ට ගිතෙල් පහන් 4 ක් දල්වන්න.

නැවත බුලත් තැන්පත් කළ මැද රවුමේ පොල් තෙල් පැන් 7 ක්ද, දකුණු පැත්තේ රවුමේ නවග්‍රහ මණ්ඩලයට ගිතෙල් පහන් 9 ක්ද දල්වන්න.

ඉන් පසු සුවඳ පැන් කල එකින් එක හිස මත තබාගෙන තුන්විට බැගින් බෝධීන් වහන්සේ වටා ප්‍රදක්ෂිණා කොට බෝධි රාජයා නහවන්න. ඇතැම් අය කලය ගෙන ගොස් කරාමයෙන් පැන් පුරවා එකවර බෝධියට හලනුද ඉඳහිට දැකිය හැකිය. එය කිසිසේත්ම ශ්‍රද්ධා පෙරදැරිව කරන්නක් නොවේ. ඉන්පසු නැවත සුදු මල් මාලාවක්ද, සුදු කහ පාට හෝ දෙපාටම ඇති හෝ කොඩි 7 කින් යුත් කොඩි වැලක්ද බෝධියට පළඳවා ස්වාභාවික නෙළුම් මල් 7 ක් පූජා කරන්න. බෝ මළුව සෑම තැනමත්, පහන් දල්වූ බුලත් මතත් රතු, නිල්, කහ, සුදු යන පාට වර්ග ඇතුළත් මල් වර්ග 9 ක් පමණ තැන්පත් කරන්න. කපුරුද මෙම ස්ථානය තුළ දල්වන්න.

බදාදා හෝ සෙනසුරාදා දිනවල පටන් ගෙන දිනපතා සතියක් කළ හැකි නම් යහපත්ය.

පැන් පෙරා ඊට සුවඳ කුඩු දමා දෝතින් ගෙන බෝධීන් වහන්සේ වෙත දක්ෂිණා වර්තව ගොස් නැහැවීම ශ්‍රද්ධා සම්පන්න සිරිතයි. බෝධීන් වහන්සේ උදෙසා මල්, පහන් පූජා කිරීමත් කළ යුතු වෙයි. ඇතැම් අවස්ථාවල බෝධීන් වහන්සේ මල් වැල්වලින් සැරසීම, ධජ පතාක එල්ලීම, බෝධීන් වහන්සේ වටා චීවරයක් දැවටීමද චාරිත්‍ර වෙයි. එසේ කළ පසු ත්‍රිවිධ රත්නය වැඳ පන්සිල් සමාදන්ව බෝධි පූජා ගාථා සහ කවි සජ්ඣායනා කරනු ලැබේ.

**බෝධි පූජා වන්දනා ගාථා**

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
(ඒ භාග්‍යවත් අර්හත් සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා.)

**සරණාගමනය**

බුද්ධං සරණං ගච්ඡාමි
ධම්මං සරණං ගච්ඡාමි
සංඝං සරණං ගච්ඡාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි

තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි
තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි
තතියම්පි සංඝං සරණං ගච්ඡාමි

බුදුන් සරණ යමි
දහම් සරණ යමි
සඟුන් සරණ යමි

දෙවනුවටත්, තෙවනුවටත්, බුදුන්, දහම්, සඟුන් සරණ යමි.

**පූජ්‍ය උඩුභාවර සුමනරතන හිමි**

''යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි.''

දළදා වරුණ
ශ්‍රී දළදා මාළිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාළිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## දුර්ලභ අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්න

මෙලෝකයේ ලැබිය හැකි දේ බොහෝය. ඇතැම් දේ සුලබය. නිරායාශයෙන්ම ලැබිය හැකිවේ. ඒවා ලබාගැනීමට වැඩි වෙහෙස මහන්සියක් හෝ වාසනා ශක්තියක් අවශ්‍ය නොවේ. නමුත් සියල්ල දත් සර්වඥ සම්මා සම්බුදුරජාණන් වහන්සේ මෙලොව ලැබිය හැකි අති විශේෂිත වූ අතිශයින්ම ලැබීමට අපහසු ලැබීම් සයක් ඇති බව දේශනා කොට වදළහ. ඒ අති දුර්ලභ ලැබීම් ලබන්නට නම් විශේෂිත වාසනා ශක්තියක් අවශ්‍ය වේ. ඒ අතුරෙහි බුද්ධෝත්පාදයක් ලැබීම, ශ්‍රී සද්ධර්මය අසන්න, දැනගන්න ලැබීම වැනි දේ දුර්ලභ කාරණා හැටියට කියවේ. මෙම උතුම් ලාභයන් ලැබූවන්ට සිදුවෙන යහපත අපමණය.

ලෝකයේ බුදුවරුන්ගේ පහළවීම දුර්ලභව සිදුවන්නකි. ඒ උතුමන්ගේ ලෝකය හිස් වූ කල මුළුමහත් ලෝකයම ධර්මයෙන් හිස්වේ. එබඳු කාලවල උපන් මිනිසුන්ට ධර්ම මාර්ගයක් විද්‍යාමාන නොවේ. ඒ හේතුවෙන් අධර්මය රජයන කාලයක් බවට පත්වීම නිසා මිනිසා සහ තිරිසනා අතරෙහි වැඩි වෙනසක් දැකිය හැකි නොවේ. මිනිසා ධර්මයෙන් ඈත් වූ තරමට තිරිසනාට සමීප වේ. මිනිසුන් සේ පෙනී සිටින බොහෝ මිනිසුන්ට අද සිදුව ඇත්තේ ඒ ටිකය.

කෙසේ හෝ අද අප හැමදෙනාම ඒ අති දුර්ලභ බුද්ධෝත්පාද කාලයක ඉපදීමේ පුණ්‍ය වාසනාව උදකරගෙන තිබේ. එසේම දුර්ලභ වූ ශ්‍රී සද්ධර්මය ලැබී තිබීම මහත් වූම වාසනාවකි. ''ධර්මය'' යන වචනය පවා අසන්නට නොලැබෙන කාල කොපමණවත් තිබේ. එබඳු කාලයක උපන් දහම්සොඬ රජතුමා ගැන ඔබට මතක ඇති. එතුමාගේ කාලයේ ධර්මය යන සංඥාවකුදු නොතිබුණේය. කෝටි ප්‍රකෝටි ගණන් ධනය වැයකොටත් දහම් බිඳක් කියාදෙන කෙනෙක් සොයාගැනීමට අපොහොසත් වූ එම රජතුමාට අවසානයේ ඉතා සුළු දහම් බිඳක් ශ්‍රවණය කිරීමට ජීවිතය පවා පූජා කිරීමට සිදුවූ බව අප අමතක කළ යුතු නොවේ. ශ්‍රී සද්ධර්මය ඒ තරමටම දුර්ලභ කාරණයකි.

අප හැමදෙනාට ඒ උතුම් දුර්ලභ වූ ධර්මයක් ලැබී ඇති මේ කාලයේ ඒ ලැබුණු දුර්ලභ අවස්ථාවෙන් ප්‍රයෝජන ගත යුතු වේ. මුතු මැණික්වලටවත් සමාන කල මහානර්ඝ වස්තූන් ලැබූ අප ඒවා ඔහේ තියෙන්නට ඉඩ හැරියහොත් එයින් ප්‍රයෝජනයක් සිදු නොවේ. අප කළ යුත්තේ ඒ උතුම් ධර්මය අපගේ ජීවිත තුළට ඇතුල් කරගෙන ඒ අනුව පිළිපැදීමයි. ධර්මයට ළංවූ තරමට එයින් සැනසුම උදාවේ. ඔබ ධර්මයේ හැසිරේ නම් ඔබව ආරක්ෂා කරගන්නට ඒ ඔබ රකින ධර්මය ඉදිරිපත් වේ. එහෙයින් ඔබ කිසිදක අතරමං නොවේ. අසරණ නොවේ. ඔබ සැමට ඒ උතුම් ධර්මයේ හැසිරී, ධර්මයේම පිහිට ලැබේවා යැයි 'දළද වරුණ' මෙත් සිතින් ප්‍රාර්ථනා කරයි. ■

පාසල් නිවාඩුවට වන්දනා චාරිකාවක්

# ඓතිහාසික අ... වඳින...



### 1. ජය ශ්‍රී මහා බෝධිය

අනුරාධපුර ශ්‍රී මහා බෝධිය පිහිටි භූමිය බුදුන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පූජනීයත්වයට පත්වූ ස්ථානයක් බවට මහාවංශයේ සඳහන් වන අතර මේ හේතුව නිසා මිහිඳු මහ රහතන් වහන්සේ විසින් එම ස්ථානයේ ශ්‍රී මහා බෝධිය රෝපණය කිරීමට සුදුසු බව තීරණය කරන ලදී. ජය ශ්‍රී මහා බෝධිය වර්තමානයේ පිහිටා ඇති භූමියට වඩා පහත් භූමියක මුලින් රෝපණය කර ඇතත් කලින් කලට බැම් බැඳීම නිසා බෝධීන් වහන්සේ පිහිටි භූමිය උස් බිමක් දක්වා වර්ධනය වී ඇත. කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ජය ශ්‍රී මහා බෝධිය වල් අලින්ගෙන් සහ වෙනත් සතුන්ගෙන් ආරක්ෂා කරගැනීම සඳහා බෝධීන් වහන්සේ වට ශක්තිමත් ප්‍රාකාරයක් කරවූ බව වංශකතාවල සඳහන් වන්නකි.

### 2. ථූපාරාමය


මිහිඳු මහ රහතන් වහන්සේගේ උපදෙස් අනුව දෙවන පෑතිස් රජු විසින් කරවන ලද ථූපාරාමයේ ගෞතම බුදුන් වහන්සේගේ හකු ධාතුව තැන්පත් කර සාදවා තිබේ. බුදුදහම ශ්‍රී ලංකාවට හඳුන්වා දීමෙන් පසුව මෙරට ඉදිකරන ලද පළමු චෛත්‍යය ලෙස ථූපාරාමය නම් කළ හැකිය. දෙවන පෑතිස් රජු විසින් කරවන ලද ප්‍රථම ආගමික ගොඩනැගිල්ල වශයෙන් සඳහන් වන ථූපාරාම චෛත්‍ය ධාන්‍යාකාර හැඩයෙන් ඉදිකර තිබේ. එහි උස අඩි 63 ක් වන අතර වට ප්‍රමාණය අඩි 194 කි. ථූපාරාමය ගෞතම බුදුන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පූජනීයත්වයට පත්වූ භූමියකි.


### 3. රුවන්වැලි මහ සෑය

රත්නමාලි මහා සෑය, ස්වර්ණමාලි චෛත්‍යය සහ මහා සෑය යන නම්වලින් හඳුන්වනු ලබන රුවන්වැලි සෑය දුටුගැමුණු රජතුමා විසින් වැඩ ආරම්භ කර ඇති අතර පසුව එතුමාගේ අභාවයෙන් පසුව දුටුගැමුණු රජුගේ සොහොයුරු සද්ධාතිස්ස රජු විසින් එහි වැඩ කටයුතු නිම කරන ලද බව ඉතිහාසයේ දැක්වේ. ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශාරීරික ධාතු නිදන් කර සාදවා ඇති රුවන්වැලි සෑය ශ්‍රී ලංකාවේ පිහිටි ප්‍රධානතම දාගැබකි. රුවන්වැලි සෑයේ උස මීටර් 103 ක් වන අතර වට ප්‍රමාණය මීටර් 290 කි. ලෝකයේ දැනට පවතින දාගැබ් අතරින් උසින් වැඩිම දාගැබ් අතරට රුවන්වැලි සෑයද ගත හැකි අතර එහි පවතින වාස්තු විද්‍යාත්මක ගුණාංග සහ ආශ්චර්යමත් බව නිසා සැදැහැවතුන්ගේ මහත් භක්තියට පාත්‍ර වී තිබේ. රුවන්වැලිය පිහිටි භූමිය ගෞතම බුදුන් වහන්සේ ඇතුළු සතර බුදුවරුන් වහන්සේලා වැඩ සිටි පාරිශුද්ධ භූමියකි.

### 4. මිරිසවැටිය


දුටුගැමුණු රජු විසින් ක්‍රි.පූ. 101 දී පමණ කරවන ලද පළමු චෛත්‍යය






''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙනෙකු

# ටමස්ථානය
# නට යමු





ලෙස ඉතිහාසයේ සඳහන් වන මිරිසවැටිය චෛත්‍යය අනුරාධපුරපුත්තලම මාර්ගයේ සැතපුම් කාලක් පමණ ගමන් කළ විට හමුවන බගවන්කුලම වැව අසබඩ පිහිටා ඇත. දුටුගැමුණු රජු විසින් සංඝයා වහන්සේට පූජා නොකර මිරිස් ව්‍යංජනයක් ආහාරයට ගත් බැවින් එහි වන්දිය ගෙවීමට මිරිසවැටිය චෛත්‍යය ඉදිකළ බවට පුරාවෘත්තවල සඳහන් වන අතර රජතුමාගේ ජයකොන්තය එහි තැන්පත් කර ඇති බව පැවසේ. සොළී ආක්‍රමණිකයන් විසින් මිරිසවැටිය චෛත්‍යය කඩා බිඳ දැමීමෙන් පසුව මහ පැරකුම්බා රජු මිරිසවැටිය චෛත්‍ය නැවත ගොඩනගා ඇති බව ඉතිහාසය සඳහන් කරයි. මිරිසවැටිය ගෞතම බුදුන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පූජනීයත්වයට පත්වූ භූමියකි.

## 5. අභයගිරිය

වළගම්බා රජු විසින් කරවන ලද විහාරයකි. වළගම්බා රජු සොළී ආක්‍රමණිකයන්ට බියෙන් පලා යන විට ගිරි නම් නිගණ්ඨයා විසින් ''මහා කළු සිංහලයා පලා යනවෝ'' යනුවෙන් කෑ ගසා තිබේ. එයින් වසර 14 කට පසුව නැවත ලක්දිව රජකමට පත්වුණු වළගම්බා හෙවත් වට්ටගාමිණී අභය රජු විසින් ගිරි නම් නිගණ්ඨයා කෑ ගැසූ ඉසව්වේ අභයගිරිය චෛත්‍යය කරවා සැඟව සිටි කාලයේ රජුට උපකාර කළ මහා තිස්ස තෙරුන්ට පූජා කරන ලද බව ඓතිහාසික පුරාවෘත්තවල සඳහන් වේ. ගෞතම බුදුන් වහන්සේ තෙවන වර ලංකාවට වැඩම කිරීමෙන් පසුව මෙම ස්ථානයේ සමවත් සුවයෙන් වැඩ සිටි බව වංශකථාවල දැක්වේ.

අභයගිරිය ඉපැරණි භාරතයේ පැවැති නාලන්දා, ජගන්දලා හා වික්‍රමශීලා වැනි බෞද්ධ ආගමික විශ්වවිද්‍යාලවලට සමාන කළ හැකිය. අභයගිරිය මහායාන සම්ප්‍රදායට අයත් මහා විහාර සම්ප්‍රදායෙන් බැහැරව ඉදිකරන ලද නිර්මාණයකි. නිකාය භේදය ශ්‍රී ලංකාව තුළ ආරම්භ වී ඇත්තේ අභයගිරිය මුල් කරගෙනය.

## 6. ජේතවනාරාමය

ක්‍රි.ව. 276303 අතර ලක්දිව රජ කළ මහසෙන් රජතුමා විසින් කරවන ලද ජේතවන චෛත්‍ය ජෝතිය නම් භූමියේ ඉදිකරවන ලද නිසා එම නම ලැබූ බව ඓතිහාසික පුරාවෘත්ත සඳහන් කරයි. ජේතවන ස්තූපය අනුරාධපුරයේ මහ දාගැබ් තුනෙන් එකකි. රුවන්වැලි සෑය, අභයගිරිය හා ජේතවනය අනුරාධපුරයේ මහ දාගැබ් තුන ලෙස සලකයි. උස අඩි 400 ක් සහ වට ප්‍රමාණය අඩි 1200 ක් පමණ වන ජේතවන ස්තූපය ශ්‍රී ලංකාවේ විශාලතම චෛත්‍යය වන අතර ලෝකයේ තෙවැනි විශාලතම චෛත්‍යයද වේ. බුදුන් වහන්සේගේ පටි ධාතුවෙන් කොටසක්, කේශධාතු සහ ශාරීරික ධාතු ජේතවන චෛත්‍යයේ තැන්පත් කර ඇති බව සඳහන්ය. ජේතවනාරාමය පිහිටි භූමිය ගෞතම බුදුන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පූජනීයත්වයට පත්වූ භූමියකි.


## 7. මිරිසවැටිය

දුටුගැමුණු රජු විසින් මිරිසවැටිය චෛත්‍යය ඉදිකිරීමෙන් පසුව සංඝයා වහන්සේලාගේ වාසස්ථානය සඳහා ඉදිකරන ලද මහල් නවයකින් යුතු සංඝාවාසයකි. එහෙත් ඒ පිළිබඳ ඇති මතය නම් මෙම ස්ථානයේ ඊට පෙර දෙවන පෑතිස් රජු විසින් සංඝාවාසයක් ඉදිකර ඇති බවත්, දුටුගැමුණු රජු විසින් එය තවදුරටත් ප්‍රතිසංස්කරණය කරන ලද බවත්ය. ලෝවාමහාපායේ වහළය තම උළුවලින් කර්වූ නිසා ලෝහ ප්‍රාසාදය යනුවෙන්ද හැඳින්වේ. ගල් කණු 1600 ක් පමණ මෙම ස්ථානයේ ඇති අතර එහි මහල් නවයක් තිබුණු බව වංශ කතාවල සඳහන් වේ. අටමස්ථානය අතර තිබෙන පූජනීය ස්ථාන හතට අමතරව තිබෙන එකම විශ්මිත නිර්මාණය ලෝවාමහාපායයි. තව්තිසා දෙව්ලොව තිබෙන ප්‍රාසාදයක් ඇසුරු කරගෙන රහතන් වහන්සේලාගේ සැලැස්මකට ලෝවාමහාපාය ඉදිකර ඇති බව සඳහන්ය.

## 8. ලංකාරාමය

අභයගිරියට අයත් වූ ආරාමයක් වන ලංකාරාමය වළගම්බා රජු විසින් කරවා ඇත. වටදාගෙයක් හා වෙනම දාගැබක් සහිත ලංකාරාමය පුරාණයේ මණිචූපාරාමය හා මණිසෝමාරාමය යන නම්වලින් හැඳින්වූ බව බෝධිවංශ ගැටපදයේ සඳහන් වේ. වළගම්බා රජු සෝමා දේවිය වෙනුවෙන් කළ සෝමාරාමයද මෙම ලංකාරාමය බව වංශ කතා පුවත්වල සඳහන් වේ. වර්තමාන ප්‍රතිසංස්කරණවලින් පසුව ලංකාරාමයේ විෂ්කම්භය අඩි 38 ක් වන අතර ස්තූපයේ පැරණි තත්ත්වයද වෙනස් වී ඇත.

**නිව්ටන් ගුණසේකර**







කු ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' (ධම්ම පදයේ 3 වන ගාථාව)

# මියන්මාරයේ ප්‍රාතිහාර්ය පෑ බුදු පිළිමය මෙන්න


## බුදු පිළිමය කිරි ගරුඬ

## නිර්මාණය කළේ චීනයට ගෙන යාමට

## බර ටොන් 7ක් පමණ

## දේශ සීමාව අසලදී බුදු පිළිමය පෙරළෙයි

## එය යළි ඔසවා තැබීමට බැරි වුණේ ඇයි?



බුදු දහම හේතුඵල න්‍යාය පිළිගන්නා සනාතන ධර්මයකි. එනමුදු ලෝකයේ විවිධ අවස්ථාවල සිදුවන්නා වූ ස්වාභාවික සංසිද්ධි හේතුඵල දහම අනුව මිනිස් සිතට වටහා ගැනීමට අසීරු අවස්ථා බොහෝය. මෙහි සඳහන් වෙන්නේ එබඳු සිද්ධි දමයකි.

අප දන්නවා මියන්මාරය අතීතයේ සිටම බුදුදහම ප්‍රචලිත වූ බෞද්ධ රාජ්‍යයක් බව. එමෙන්ම ලොව සුපතල කිරිගරුඬ පිළිම නිර්මාණය කිරීම අතින් ඉදිරියෙන්ම හිඳින රාජ්‍යයක් ලෙසද හඳුන්වන්න පුළුවන්. තම රටේ අවශ්‍යතාවන්වලට වගේම අසල්වැසි රටවලින් කෙරෙන ඉල්ලීම් අනුව අපගේ පිළිම නෞකා ප්‍රවාහනය කර දීම මියන්මාරයේ විදේශ විනිමය උපයන එක් මාර්ගයක්ද වී තිබේ.

මෙහි පළවී තිබෙන ඡායාරූපයෙන් දැක්වෙන්නේ මෑත භාගයේදී චීන රජයෙන් ලැබුණ ඇණවුම් කිරීමක් මත එරටට ගෙනයාම පිණිස මියන්මාරයේදී නිර්මාණය කරන ලද අති ශෝභමාන වූද, අති දැවැන්ත වූද කිරිගරුඬ බුදුපිළිම වහන්සේ නමකි. බරින් ටොන් 67 පමණ වන මෙම සුන්දර නිර්මාණය විශාල ට්‍රක් රථයක් උපයෝගී කර ගනිමින් ගොඩබිම් මාර්ගය හරහා චීනය වෙත ගෙනයාමට නියමිත විය.

හිමාලයේ කඳුවැටියේ නැගෙනහිර අර්ධය මියන්මාරය හා චීනය අතර පිහිටා ඇති සේම කිරිගරුඬවලින් ගහන එම කඳුකරය හරහා දෙරටේ දේශසීමාව මෙන්ම අතිශයින්ම දුෂ්කර දුර්ග හරහා ගොඩබිම් මාර්ගයද විහිදී ඇත. දෙරටේ වෙළෙඳ හා ප්‍රවාහන කටයුතු වැඩිපුර සිදුවෙන්නේද මෙම දුර්ග මාර්ග හරහාය.

ඉහත සඳහන් කළ පරිදි සුවිසල් බුදු පිළිම වහන්සේ ට්‍රක් රථයෙහි වඩා හිඳුවා දුෂ්කර ගොඩබිම්

මාර්ගය ඔස්සේ කිලෝ මීටර් සිය ගණනක් කිසිදු උපක්‍රමයකින් තොරව වැඩම කරගෙන ගිය තමුදු දෙරටේ දේශසීමාව බඳු ප්‍රදේශයට ආසන්න වත්ම කඳු ගැටයක් පාමුල පිහිටි තැනිතලා බිම් කඩකදී එකවරම පිළිමය සහිත ට්‍රක් රථය පාර හරහා පෙරළී ගොස් මහා මාර්ගය දෙපසටම අවහිර විය. පිළිම වහන්සේට කිසිදු හානියක් සිදු නොවුණද සිදු වූයේ කුමක්දැයි කිසිවෙකුටවත් අදහා ගත නොහැකි විය.

මියන්මාර බලධාරීන් මෙන්ම හමුද ප්‍රධානීන්ද වහාම එම ස්ථානයට පැමිණ සිදුවී තිබෙන විනාශය දැක කම්පාවට පත්වූවත් කෙසේ හෝ පිළිම වහන්සේ චීනය වෙත ප්‍රවාහනය කළයුතු බවට තීරණය කර පිළිම වහන්සේ නගා සිටුවීම පිණිසත්, මාර්ග අවහිරය ඉවත් කිරීම සඳහාත් අවශ්‍ය විධිවිධාන යොදන ලදී.

ඒ අනුව යෝධ ක්‍රේන් යන්ත්‍ර වහාම ගෙන්වා ඒ මගින් පිළිම වහන්සේ සහිත ට්‍රක් රථය ගොඩගැනීමට පරිශ්‍රමයක් දරන්නට යෙදුණි. එම ප්‍රයත්නය කොතෙක් නිෂ්ඵල වූයේද යත් ක්‍රේන් යන්ත්‍රවල යෝධ යදම් කැඩී බිඳී ගියද ට්‍රක් රථය සෙලවීමට පවා අපහසු විය. කළයුත්තේ කුමක්දැයි අදහාගත නොහැකිව බලධාරීන් විමතියට පත්වෙද්දී ඔවුන් තීරණය කළේ මේ අනතුර සිදුවීමට කිසියම් හෝ ගුප්ත බලවේග යක් ක්‍රියාත්මක වන්නට ඇති බවය. හේතුවක් නොදැක ඵලය පමණක් අත්දැකීමට සිදුවන අවස්ථා පවතින බව මුලින් සඳහන් කරන ලද්දේ එබැවිනි. බැතිමත් ජනතාව ගුප්ත බලවේගය, ප්‍රාතිහාර්යය, දේව බැල්ම, දේව කැමැත්ත ආදී වශයෙන් හඳුන්වන්නේ එය බව පැවසීමට පුළුවන.

බලධාරීන්, හමුද ප්‍රධානීන්, මහා සංඝයා එක්ව තීරණාත්මක සාකච්ඡාවක නිරත වී එක්තරා තීරණයකට එළඹුණහ. එනම් පිළිම වහන්සේ බැහැර රටකට රැගෙන යනවාට අදෘශ්‍යමාන බලවේග අකමැති බවත් ඒ සඳහා තවදුරටත් ප්‍රයත්න දරුවහොත් විශාල විනාශයක් සිදුවීමට ඉඩ තිබෙන බවත් සලකා කවර හේතුවක් නිසාවත් පිළිම වහන්සේ චීන දේශයට වැඩම නොකරවන බවටත්, අනතුර සිදුවූ ස්ථානයේම සුදුසු පරිසරයක අභිනවයෙන් විහාර මන්දිරයක් ඉදිකොට එහි වඩා හිඳුවා පුද සත්කාර පවත්වන බවටත් පිළිම වහන්සේ මියන්මාර් දේශයේම රඳවා ගන්නා බවටත් පොරොන්දු දී නිරුපද්‍රිතව පිළිම වහන්සේ නගා සිටුවීමට හැකිවේවායි ප්‍රාර්ථනාවක්ද සිදු කළේය. එපමණක් නොව දේශපාලනික වශයෙන් ඇතිවිය හැකි ඕනෑම උවදුරකට තමන් නොබියව මුහුණ දෙන බවටද සපථ කළේය.

අනතුරුව එම ස්ථානයේ තාවකාලික ශාලා ඉදිකර මහා සංඝරත්නය වැඩම කරවා සෙත් පිරිත් සජ්ඣායනා කොට දානමාන කටයුතු සිදුකර යළිත් ක්‍රේන් යන්ත්‍ර යොදවා පිළිම වහන්සේ නගා සිටුවීමට ප්‍රයත්නයක් දරුවේය. එහිදී රැස්ව සිටියවුන් පුදුමයෙන් පුදුමයට පත් කරමින් කිසිදු ආයාසයකින් තොරව බුදු පිළිසය සහිත ට්‍රක් රථය ගොඩ ගැනීමට හැකිවිය. සියල්ලෝම සාධු නද පවත්වමින් පිළිම වහන්සේ මහා ප්‍රාතිහාර්යයක් පෑ බවට ප්‍රීති ඝෝෂා පවත්වන්නට විය. ඉන්පසු එම ස්ථානයේ තාවකාලික මණ්ඩපයක් ඉදිරිකර පිළිම වහන්සේ එහි වඩා හිඳුවා නන් අයුරින් පුද පූජා පවත්වන්නට කටයුතු යෙදීය.

හමුද නිලධරයන් සහ රජයේ නිලධාරීන්ගේ කැපවීම මත අසල පිහිටි වනගත කඳු ගැටය එළි පෙහෙළි කර කඳු මස්තකය දක්වා අභිනවයෙන් මහා මාර්ගයක් ඉදිකොට එහි මනරම් විහාර මන්දිරයක් ඉදිකිරීමට පියවර ගත්තේය. ට්‍රක් රථයෙන්ම බුදු පිළිම වහන්සේ විහාර මන්දිරයට වැඩම කරවා එහි තැන්පත් කරන ලදී.

විහාර ගෙය අවට දර්ශනීය මල්ගොමු, ලියගොමු සකස් කොට මුළු පරිසරයම අලංකාරවත් ලෙස ඉදි කළේය. සැම දෙනාගේම සහභාගිත්වයෙන් පෙරහර, පින්කම්, දානමාන කටයුතු සිදුකර බුදු පිළිම වහන්සේට නන් අයුරින් පූජෝපහාර පවත්වන්නට යෙදුණි. එතැන් පටන් අද දක්වාම වාර්ෂිකව පෙරහර පින්කම් උත්සව ආදිය පවත්වාගෙන එමින් සිටී.

කුඩා දරුවකු පාසල් යාමට අකමැතිව තම මෑණියන්ගේ අත ගසා දමමින්, හඬා වැළපෙමින්, බිම පෙරළී අකමැත්ත ප්‍රකාශ කරන්නේ යම් සේද දේශසීමාව ආසන්න ප්‍රදේශයේදී රථය පෙරළී ගොඩ ගැනීමට නොහැකි අයුරින් පිළිම වහන්සේගේ හැසිරීම වෙනත් රටකට යාමට පවතින අකමැත්ත ප්‍රකාශ කිරීමක් බඳු බවට මියන්මාර් වැසියන්ගේ හැඟීමය. ඉහත දක්වූ කරුණු අනුව මෙම බුදුපිළිම වහන්සේ ප්‍රාතිහාර්ය පෑ බුදුරුව වශයෙන් ප්‍රචලිත වී දෙස් විදෙස් බැතිමතුන්ගේ මහත් ගෞරවාදරයටත්, සංචාරක ආකර්ශනය දිනාගත් ස්ථානයක් බවටද අද අවසේ පත්ව ඇත.

**එස්. ආර්. එම්. ජයසේකර - මාවනැල්ල**

# මාස්පොත ලොකු හාමුදුරුවෝ අසූහත් වැනි වියට පා තබති

**කුරුණෑගල** මාස්පොත ශ්‍රී ගංගාරාම ඓතිහාසික බෝධිපූජා විහාරස්ථානය, කුරුණෑගල හෙට්ටිපොළ ශ්‍රී නාගරුක්ඛාරාමය, වාරියපොල වේරපොල පුරාණ රජමහ විහාරස්ථානය යන විහාරස්ථානයන්හි විහාරාධිපති වූද, මාස්පොත ශාසනාරක්ෂක බලමණ්ඩලයේ ගරු සභාපති වූද, කෝන්වැවේ සිරිරතනාභිධාන නායක නාහිමිපාණන් වහන්සේගේ ජන්ම දිනය 2015.08.26 වෙනි දිනට යෙදී තිබිණ. මාස්පොත කී පමණින්ම මුළුමහත් ලක් වැසියනටම හැඟී යන්නේ අප සැම දෙනෙක්ම එක සිතින් ගරු බුහුමන් දක්වන පුද පූජාවන් සිදුකරන "බෝධි පූජා පන්සල" යන ආකල්පයයි.

මාස්පොත ලොකු හාමුදුරුවෝ වර්ෂ හැටකටත් අධික කාලයක පටන් ආරම්භ කොට පවත්වාගෙන එන්නට යෙදුණ බෝධිපූජා වැඩ පිළිවෙළ නිසා අද මුළුමහත් ලෝක සත්ත්වයාටම සෙත සලසන, ලෙඩ දුක් සුව කරදෙන, තම සිතුම් පැතුම් ඉටුකර දෙන පින් බිමක් බවට පත්වී හමාරය. ඒ උන්වහන්සේගේ අපරිමිත කරුණාව හා මෛත්‍රිය එක්කොට ගොඩනගා ගත් අනුහස් බලය තුළිනි. දිනපතා පැමිණෙන දහස් ගණන් බැතිමතුන්ගේ දුක් කම්කටොලුවලට උන්වහන්සේ කරුණාන්විත සිතකින් ආශිර්වාද කරන ආකාරය ඉතා විශිෂ්ටය. අන්ත අසරණ ජනතාවගේ ප්‍රශ්න ගැටලුවලට බෝධීන් වහන්සේගේ ආශිර්වාදය ලබාදෙන්නේ අපරිමිත කරුණාවකින් යුක්තවය.

තපෝ වෘද්ධ, ගුණ වෘද්ධ. වයෝ වෘද්ධ, ඤාණ වෘද්ධ ගුණයන්ගෙන් හෙබි උන්වහන්සේ මුළු මහත් සත්ත්වයාටම එක සමානව ආශිර්වාද කරන භික්ෂූන් වහන්සේ නමකි. උන්වහන්සේගේ ජන්ම දිනය නිමිති කොටගෙන 2015.8.25 වන දින රාත්‍රියෙහි පළාතේ සම්භාවනීය භික්ෂූන් වහන්සේලා එකතුව සෙත් පිරිත් සජ්ඣායනය කොට ආශිර්වාද කිරීමද, පසු දින 25 නමක් උදෙසා සාංඝිකමය දානයක් ලබාදීමට සිදුවිය. ඊට අමතරව ජන්ම දිනය නිමිති කොටගෙන 28 වෙනි දින උන්වහන්ස්ගේ පින්බර දෑතින් බත් පාර්සල් 2000 ක් ජනතාව උදෙසා පරිත්‍යාග කිරීමත් සිදුවිය.


# කුළුගම්මන දේවමිත්ත හිමි ගුණසමරු පින්කම සැප්තැම්බර් 2930 දිනවල

**අපවත්** වී වදාළ උඩරට අමරපුර නිකායේ ශාසන ජෝතික කාරක මහා සංඝ සභාවේ ලේඛකාධිකාරී, එනීය සංඝනායක මහනුවර විද්‍යායතන පිරිවෙන් විහාරාධිපති කුළුගම්මන දේවමිත්ත නාහිමි ගුණසමරු පින්කම සැප්තැම්බර් 29, 30 දිනවලදී විද්‍යායතන පිරිවෙන් විහාරාධිපති, කාරක සභික ශාස්ත්‍රපති වල්දෙණියේ ගුණරතන හිමියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වේ. 29 සවස ආගමික වැඩසටහන් මාලාවකි. 30 දවල් මහා සංඝරත්නය විසිපස් නමක් විෂයෙහි පිරිනමනු ලබන සංඝගත දක්ෂිණාවකි.

**කේ. බණ්ඩාරනායක**

# බෞද්ධ සාහිත්‍යයේ එන සුදු ඇතා සොයා ගියෙමු

බෞද්ධ සාහිත්‍යයේ හා බුද්ධ චරිතයේ පූජනීයත්වය, පාරිශුද්ධත්වය සංකේතවත් කරමින් සුදු ඇතා ගැන බොහෝවිට කියැවේ. පෙර පින් මහිමය හෝ දෙවියන් නිසා අලිහැලි හෙවත් සුදු ඇතුන් ලැබෙන බව විශ්වාසයයි. විද්‍යාත්මකව සුදු වර්ණය ලැබීමට ඉංග්‍රීසියෙන් ''ඇල්බිසෝ'' හෙවත් අලි විකෘතිය ලෙස එයි. සුදු ඇතා අනිත් ඇතුන්ට වඩා පින්වත් වැඩි සැලකිලි ලබන, නුවණ ඇති උසස් ගති පැවතුම් ඇති ලෙස පිළිගැනෙයි. සුදු ඇතෙකු ලැබීම ඉතා කලාතුරකින් සිදුවන නිසා එවැනි දුර්ලභ ඇතුන් රාජකීය හෙවත් මංගල ඇතුන් ලෙස සලකන ලදී. සුදු පාට මංගල වර්ණයකි. ජනප්‍රවාද අනුව ශ්‍රී පාදයට අධිපති සමන් දෙවිඳුගේ වාහනය සුදු ඇතෙකි. සමන් දෙවි ගැන කියවෙන කවි පොත්වල ශ්‍රී පාද අඩවියේ අලි ඇතා ගැන කියවෙයි. අවාරයේ වූ මළුවට පැමිණ




"උත්සාහවන්තයා සියල්ල ජයගනී වණ්ණුපථ ජාතකය"

සිරිපතුල නමදින බව විශ්වාසයයි. හතර කෝරළේ අලුත්නුවර දෙවියන්ගේ වාහනයද සුදු ඇතෙකි.

බෞද්ධ සාහිත්‍ය අනුව ශක්‍ර දෙවිඳුගේ ඓරාවන ඇතා සුදු ඇතෙකි. ඓරාවන ධවල හස්තියෙකු බව සාහිත්‍ය ග්‍රන්ථවල එයි. ධවල හෙවත් අලි ඇතා මෙන්ම මුළුමනින්ම කාලවර්ණ ඇතාද ඉතා දුර්ලභ, වටිනා එකෙකු වෙයි. බෝසතුන් මවුකුස පිළිසිඳ ගත් දින මහාමායා බිසව දුටු සිහිනය අනුව ඇය අනවතත්ත විල්තෙරට ගෙන ගොස් දෙවඟනන් විසින් නාවා පිරිසිදු කොට සරසන ලදුව කුස තුළට සුදු ඇත් පැටවෙකු පිවිසෙනු දුටු බව කියවෙයි. බුද්ධ චරිතය විස්තර කෙරෙන සංස්කෘත "ලලිත විස්තරයේ" මේ සිද්ධිය ඉතා චමත්කාරව වර්ණනා කරයි. මෙහි සුදු ඇතා ලෙස සංකේතවත් වූයේ මවුකුස පිළිසිඳ ගැනීමයි. බෝසතුන් බිහිවූ දින පන්සියයක් සුදු ඇතුන් කපිලවස්තු නුවර වටා ප්‍රදක්ෂිණා කළ බව මහායාන බෞද්ධ ග්‍රන්ථවල එයි. තරුණ වියේ පසුවන බෝසතුන් දිනක් ගමනක් යනවිට දෙව්දතුන් විසින් මරා දැමූ සුදු ඇතෙකුගේ මළසිරුර බෝසතුන් යන මහමග දමා තිබුණි. සිද්ධාර්ථ කුමරු එම සුදු ඇතාගේ මළසිරුර ඔසවා ඉවතට වීසි කළ බව ලලිත විස්තරය කියයි. 5 වැනි සියවස මුල ලංකාවට ආ චීන ජාතික පාහියන් හිමි කියන තොරතුරු පරිදි අජාසත් රජු හා දේවදත්තගේ මෙහෙයවීමෙන් බුදුහිමි වඩින පෙර මගට බුදුහිමිට විපත් කිරිමට රා පොවා යැවූ නාලාගිරි ඇතා දුර්ලභ කළු ඇතෙකි. සුදු ඇතුන් දඹදිව හිමාලය, ශ්‍රී ලංකාව, බුරුමය, තායිලන්තය වැනි රටවල සිටින බවට, ජීවත් වූ බවට සාධක ඇත. හිමාලයේ වසන බව කියන උපොසථ, ඡද්දන්ත යන කුලවල ඇත්තු ස්වභාවයෙන්ම සුදුය. උන්ට අහසින් යා හැකි වූ බව සාහිත්‍ය ග්‍රන්ථ කියයි. චක්‍රවර්තී රජෙකුගේ වාහනය වන්නේ උපොසථ හෝ ඡද්දන්ත කුලයේ ඇතෙකි. චක්‍රවර්ති රජෙකු පහළ වූ විට උන් එම රජු වෙත අහසින් එන බව කියවෙයි. "බෝධිවංශය" චක්‍රවර්ති ලක්ෂණ විස්තර කිරීමේදී චක්‍රවර්තී රජෙකුට ධවල ශරීර ඇති, අහසින් යා හැකි, රිදී පර්වතයක් බඳු උපොසථ හෝ ඡද්දන්ත කුල ඇතෙකු එන බව කියයි. ඡද්දන්ත කුලයේ නම් එන්නේ හැමටම බාල සුදු ඇතෙකි. උපොසථ කුලයේ නම් හැම ඇතුන්ටම ප්‍රධාන ඇතා චක්‍රවර්තී රජුගේ වාහනය වෙයි. බෝධිවංශය අනුව කාලිංස චක්‍රවර්තී රජුට වාහනය වූයේ උපොසථ කුල සුදු ඇතෙකි. අලි ඇතෙකු සිටියොත් ඌ ඡද්දන්ත හෝ උපොසථ කුලයට අයත් ඇතෙකු අහසින් අවුත් වදා ගිය ඇත් පැටවකු හෝ දෙවියන් දුන් සතෙකු බව බෞද්ධ විශ්වාසය විය.

ජාතක පොතේ වෙස්සන්තර ජාතකය අනුව වෙස්සන්තර රජු දන් දුන්නේ සුදු ඇතෙකි. වෙස්සන්තර කතාව දක්වන "බුත්සරණ" කර්තෘ විද්‍යා චක්‍රවර්තී වෙස්සන්තර රජු දන් දුන් ඇතා දෙවියන් දුන් "සර්ව ශ්වෙත පච්චය" නම ඇති නියඟ කාලයට වර්ෂාව ලබාදෙන ඉතා දුර්ලභ සුදු ඇතෙකු බව කියයි. මනුෂ්‍ය ලෝකයට ඉතා දුර්ලභ මේ සුදු ඇතා බලා ගැනීමට ඇත් රැටියන්, ඇත් වෙදුන් ආදී පන්සියයක් කුලවල අය හා ඌ නාවනු, කවනු, පොවනු පිණිස වෙනම පිරිවර විය. උගේ විශේෂ පළඳනා හැර ආභරණ සැරසිලිවල වටිනාකම සූවිසි ලක්ෂයක් බව "බුත්සරණ" කියයි. සුදු ඇතෙකු සිටින විට ඌ සිටින තැන වියන් බැඳ වටිනා රන් බඳුන්වල ආහාර දෙයි. සුවඳ දුම් අල්ලයි. විශේෂ ස්ථානයක තබයි. රන් ආභරණින් සැරසී උගේ පිටට නගින බව කියවෙයි. මේ සඳහා විශාල සේවක පිරිසක්, අධික වියදමක් දැරීමට විය. විශාල වත් පොහොසත්කම් ඇති රජෙකුට පමණක් සුදු ඇතා නඩත්තු කළ හැකිය. උගෙන් වැඩ නොගයි. කෑමට බීමට සැරසීමට සේවකයින්ට විශාල මුදලක් වැයවෙයි. මහාචාර්ය පී. ඊ. පී. දැරණියගල ලියූ "අලි පිළිබඳ විද්‍යාව" ග්‍රන්ථය අනුව ආසියානු ඇතා "එලිෆාස් මැක්සිමස් ලින්කේ" නම් වෙයි.




දැරණියගල කියන පරිදි ආසියානු ඇතාගේ උප කුල 14 ක් ඇත. ලංකාවේ උප කුල තුනක් විය. ඉන් "වීල් අලියා" උ උප කුලය වඳ වී ගොස් ඇති අතර අද උප කුල දෙකක් ඉතිරිව ඇත. ලංකා ඉතිහාසයේ සඳහන් වන සුදු ඇතුන් පිළිබඳ දුර්ලභ තොරතුරු කීපයක් දැන් බලමු.

ලංකාවේ අතීත ඉතිහාසය අළලා ලියවුණු සන්කෝනියන්ගේ "ජිනිසියානු ඉතිහාසය" අනුව ලංකාවේ අගරජුට කාලවර්ණ ඇතුන් දහසක් හා සුදු ඇතුන් පස්දෙනෙක් සිටි බව කියයි. සන්කෝනියන්ගේ ජිනීසියානු ඉතිහාසය අගරජුට සුදු ඇතුන් පස්දෙනෙකු සිටි බව කීම වැදගත්ය. දුටුගැමුණු රජු කල (ක්‍රි.පූ. 161137) සිටි විජිතපුර සටනට මූලික වූ කඩොල් ඇතා සුදු ඇතෙකි. මහාවංශයට අනුව දුටුගැමුණු කුමරු උපන් දින ඡද්දන්ත කුලයේ ඇතෙකු ගංතෙරට පඳුරු අතර තබා ගොස් සිටි මේ සුදු

"අනුවණකම නිසා නොදැන ක්‍රියා කරන්නෝ විනාශය කරා ළඟාවෙති" අපණ්ණක ජාතකය

ඇත් පැටවා "කඩොල්" නම් වැද්දට හමුවී රජුට දන්වූ නිසා කඩොල් වැද්දගේ නමින් ඇතාට කඩොල් ඇතා යයි නම් තබා ඇත. ථූපවංශයට අනුව ගැමුණු කුමරුගේ පිනින් හිමාලයේ ඡද්දන්ත කුල ඇතින්නන් අහසින් පැමිණ ගංතීරයක මේ ඇත් පැටවා දමා ගිය බව කියයි. "සද්ධර්මාලංකාරයේ" දුටුගැමුණු වස්තුව අනුව උපොසථ කුල ඇතින්නක් අහසින් අවුත් තිත්ත විල නම් විල සමීපයේ සිරුර මුළුමනින් සුදු අලි ඇත් පැටවකු බිහිකර ගියාය. මහාවංශය, ථූපවංශය, සද්ධර්මාලංකාරය අනුව කණ්ඩුල හෙවත් කඩොල් ඇතා ධවල හස්තියෙකු බව පැහැදිලිය. කඩොල් ඇතා විජිතපුර සටනට පෙරමුණ ගෙන යුද වැදුණු අතර වූ වැසි වැස්සීම අහසින්



ගිය බව කියා නැත. විජිතපුර සටනේදී සතුරන් කකාරන ලද ලෝදිය උගේ පිටට වත් කරන ලදුව ඌ වේදනාවෙන් කෑගසමින් අසල වූ දිය අගලේ ගිලුණේය. එවිට ගැමුණු රජු ඇත් වෙදුන් ලවා කඩොල් ඇතාට ප්‍රතිකාර කර උගේ සමට මී හරක් හම් තබා බැඳ ආරක්ෂා සැලසූ බව කියයි. කාවන්තිස්ස රජු මිය ගොස් ගැමුණු කුමරු කොත්මලේ වෙස් වලාගෙන සිටියදී කුමරු සොයා ආ පිරිස ඉදිරියේ කොත්මලේ පුහුල්පිටියේ විහාරයේ ගල්තලාවේදී රාජ දූතයන් සමග ආ සුදු ඇතා රජකම සඳහා ගැමුණු කුමරුට දණ නමා ආචාර කර පිටට නැගීමට ඉඩ දුන් බව කියවෙයි.

චූලවංශය අනුව මායාරට මානාභරණ රජු හා රත්නාවලී දේවිය දරුවන් නැතිව දුකින් දරුවකු පතා නොයෙක් දේව පූජා කළේය. දිනක් රත්නාවලී බිසව වෙත ඇත් පැටවකු පැමිණ තමා වැළඳ ගන්නා බව සිහිනෙන් දුටුවාය. සිහිනය තේරුම් කළ බමුණන් කීවේ ඉතාම පින්බර කුමරෙක් රත්නාවලී බිසවගේ කුස පිළිසිඳ ගත් බවයි. චූලවංශය අනුව මානාභරණ රජුට දව රත්නාවලී බිසව කුස පිළිසිඳ ගත් ඒ කුමරු පොළොන්නරුවේ මහා පරාක්‍රමබාහු රජුය. (1157 1183) මේ සිද්ධිය විස්තර කරන ගයිගර් තම චූලවංශ ඉංග්‍රීසි පරිවර්තනයේදී සුදු ඇතා ලංකාවේ ඉතා පාරිශුද්ධ සතෙකු වූ බව කියයි.

කුරුණෑගල කල ලංකාවට ආ විදේශ සංචාරකයකු වූ "ඉබන් බටූතා" කියන පරිදි කුනකර් රජුට (ඉබන් බටූතා කියන කුනකර් රජු යනු එද කුරුණෑගල කල රජකළ රජු බව පෙනෙයි.) අලි ඇතෙකු සිටි බව කියයි. මේ ලොව අන් කිසිම කෙනෙකුට එබඳු වස්තුවක් නැති බව ඉබන් බටූතා කියයි. සුදු ඇතෙකු තමා දුටු පළමු අවස්ථාව මේ බව ඔහු කියයි. උත්සව අවස්ථාවල මේ සුදු ඇතා රතු මැණික් ආදියෙන් සරසා රජු ඌ පිට නැගී යන බව ඉබන් බටූතා කියයි.

බුරුමය හා තායිලන්තයේ සුදු ඇතා උසස් කොට සලකයි. සියම් රජුට සුදු ඇතෙකු සිටින බැවින් රජුට "ධවල ගජපති" යන විරුදාවලිය යෙදෙයි. ධවල ගජපති යනු සුදු ඇතුන් හිමි රජු යන අර්ථය දෙයි. තායිලන්ත රජවරු ධවල ගජපති විරුදාවලිය භාවිතා කරති. තායිලන්තයේ අවුරුදු පතා සුදු ඇතුන් සඳහා ප්‍රණාම උළෙලක් පවත්වයි.

ලංකාවෙන් මිලදී ගත් සුදු අලියකු ඕලන්ද වෙළෙඳ සමාගම 1639 ඇම්ස්ටර්ඩෑම් නුවරදී ප්‍රදර්ශනයට තබා ඇත. ශ්‍රී විජය රාජසිංහ රජු (17391747) උපසම්පදාව ගෙන ඒමට සියමට ගිය විල්බා ගෙදර මොහොට්ටාල තම ගමන ගැන ලියා ඇති වාර්තාවල සඳහන් පරිදි සිංහල දූත පිරිස සියමේදී සියම් රජු සතු රිදී දම්වැලකින් බඳින ලද ඉතා වටිනා සුදු ඇතෙකු දැක ඇත.

1736 පහතරට ඕලන්ද වෙළෙඳ සමාගමේ දූතයෙකු ලෙස උඩරටට ආ ඕලන්ද තානාපති ඩැනියල් ආදීන් උඩරටට පැමිණ දුටු විස්තර වාර්තාව අනුව සෙන්කඩගල රජමැඳුර ඇසල උයනකදී ඩැනියල් ආදීන් පිළිගැනීමට උළෙලක් විය! මේ පෙරහරේ ඇතුන් රාශියක් විය. (මේ වනවිට උඩරට රජු ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහයි.) මේ ඇතුන් අතර අනිත් ඇතුන්ට වඩා විශාල තනි සුදු පාට එක් ඇතෙකු විය. මේ තනි සුදු ඇතා මෙල්ල කළේ සුදු උඩු රැවුලක් ඇති මහල්ලෙකි. ඔහුගේ සහයට හෙණ්ඩු රැගත් තවත් තිදෙනෙකු විය. නරේන්ද්‍රසිංහ රජු කල සිටි මේ සුදු ඇතා ගැන ඩැනියල් අදත් තොරතුරු දක්වයි.

තිස්ස, සූරියවැව, හම්බන්තොට, වැල්ලවාය යන පොලිස් වසම් හතර මැදිව බෝදගම මත්තල අතර පිහිටි අලුක්කන්වැව ඇත් රංචුවකට මැදිවී දළ හතරකින් යුතු සුදු ඇතෙකු සිටින බව 1982 මාර්තු 4 "දිනමිණ" පත්‍රයේ පළවිය. මේ වාර්තාව අනුව තිස්ස අඩවියේ ගැවසුණු සුදු ඇතාට දළ හතරක් විය.


මැදවච්චි හමඩගස්වැව කැලේ දිග දළ ඇති සුදු ඇතෙකු ගැවසෙන බව 1981 ජූනි 30 "දිනමිණ" පත්‍රයේ පළවිය. දැනට වසර දෙකකට පමණ පෙර කතරගම අවට ඇත් රංචුවක සිටින සුදු ඇතෙකු ගැන තොරතුරු පුවත්පත්වල පළවිය. මේ සුදු ඇතා කතරගම අවට කැලෑවල ගැවසෙයි.

**එස්. කේ. ජයවර්ධන**

# මැලිබන් කිරි

# අභයදාන

**ගව සම්පත සුරැකීමේ මහඟු සත්කාරය.....**








**නාවලපිටිය ශ්‍රී කාවීශ්වර වේළුවණාරාම මහා විහාරාධිපති ත්‍රිපිටකවේදී ශාස්ත්‍රපති අතිපූජ්‍ය හකිරිල්ලේ ධම්මාලංකාර නායක හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් 1750 වැනි කිරිගවයා මරණින් මුදවාගෙන නිදහස් කරන ලදී.**

**නිකිණි පුර පසළොස්වක පොහොය නිමිත්තෙන් නිදහස් කරන ලද කිරි ගවයන්**

★ ශ්‍රී සුදර්ශණ පූජාභූමි මහා විහාරය,බූස්ස කිරිගවයන් 06 දෙනෙකු (1736 - 1741)
★ ශ්‍රී උපෝෂතාරාම මහා විහාරය, කරලියද්ද කිරිගවයන් 04 (1742-1745)
★ දොරමඩලාව රජමහා විහාරය, මිහින්තලේ කිරිගවයන් 02 (1746-1747)
★ කසාගල රජමහා විහාරය, කුඹුක්ගැටේ, කුරුණෑගල කිරිගවයන් 02 (1748-1749)
★ ශ්‍රී කාවීශ්වර වේළුවණාරාම මහා විහාරය, නාවලපිටිය කිරිගවයන් 02 (1750-1751)

Maliban Kiri

මැලිබන් කිරි අභයදානයට සහභාගිවීමට අමතන්න,
සම්බන්ධීකරණ උපදේශක : +94 774 558 570

ලෝකවාසී බෞද්ධ ජනතාවගේ වන්දනාමානයට පාත්‍රවන ත්‍රිවිධ චෛත්‍ය ලෙස ශාරීරික, පාරිභෝගික හා උද්දේසික යන්න හඳුන්වා දිය හැකිය. බුදුන් වහන්සේගේ ශරීරයේ වූ කොටස් ශාරීරික ලෙසද උන්වහන්සේ භාවිත කළ දේ පාරිභෝගික ලෙසද හඳුන්වන අතර උද්දේසික වශයෙන් බුදුරදුන් පිදීම සඳහා බුදු පිළිමය යොදා ගනු ලැබේ.

බෝධිය, වජ්‍රාසනය, ත්‍රිරත්නය හා සිරිපතුල වැනි සංකේත මුල් කාලයේදී බෞද්ධයන් විසින් බුදුන් වහන්සේ වෙනුවට යොදා ගනිමින් වන්දනාමාන කළද ක්‍රිස්තු වර්ෂයෙන් ප්‍රථම වර්ෂයේ සිට බුදුරුව හෙවත් බුදුපිළිම භාවිතයට ගනු ලැබීය. මුල්ම බුද්ධ රූප වශයෙන් සලකනු ලබන්නේ කණිෂ්ක රජුගේ කාසිවල හා ඔහු විසින්ම නිර්මාණය කරවූ ෂාජිකි ඪෙරිහි තුබූ ධාතු කරඬුවේ ඇති බුදු රුවය. අප රටේ නිර්මාණය කළ බුදු පිළිම ඒවායේ ඉරියව්ව අනුව ප්‍රධාන කොටස් තුනකට වෙන් කර දක්විය හැකිය. එනම් හිඳි පිළිම ඒවායේ ඉරියව්ව අනුව ප්‍රධාන කොටස් තුනක් වෙන්කර දක්විය හැකිය. එනම් හිඳි පිළිම, හිටි පිළිම හා සැතපෙන පිළිම. මේවායින් සැතපෙන පිළිමය සම්බුද්ධ පරිනිර්වාණය විදහා දක්වතැයි අදහස් කෙරේ.

අත් හා ඇඟිලි ශෛලිගතව නිරූපණය කරන ආකාරය හෙවත් මුද්‍රා කිහිපයක්ම හිඳි පිළිමය තැනීමේදී භාවිතයට ගනු ලැබීය. මෙයින් ලංකාවේ භාවිත වූයේ සීමිත මුද්‍රා ගණනකි. බුදු පිළිමය හා බැඳුණු සාම්ප්‍රදායික වශයෙන් පොදු සම්මුතියට පත් මුද්‍රා සංඛ්‍යාව හයකි.

**1. සමාධි මුද්‍රාව**
**2. ධර්මචක්‍ර මුද්‍රාව**
**3. අභය මුද්‍රාව**
**4. විතර්ක මුද්‍රාව**
**5. භූමිස්පර්ශ මුද්‍රාව**
**6. වරද මුද්‍රාව**

### 1. සමාධි මුද්‍රාව

ධ්‍යාන මුද්‍රාව නමින්ද හඳුන්වයි. වීරාසන හෝ පද්මාසන ශෛලියෙන් හිඳ උඩ අතට හැරවූ වම් අත්ල මත දකුණු අත්ල පිහිටුවා වැඩසිටීම ධ්‍යාන සමාධි මුද්‍රාවයි.

මෙහි ඇතුළත් ලක්ෂණ තුනකි.

1. පා නමාගෙන දකුණු පතුල උඩට හරවා වම් කලවය මතත් වම් පතුල උඩට හරවා දකුණු කලවය මතත් සිටින සේ වාඩි වීම.

2. උඩු කය කෙළින් තබා ගැනීම.


3. කමටහනට සිත යොමු කිරීම.


සමාධි මුද්‍රාවෙන් සංකේතවත් කරන්නේ බුද්ධත්වයයි. ශ්‍රී ලංකාවේ බුදු පිළිම අතර බහුලවම ඇත්තේ සමාධි මුද්‍රාව සහිත බුදු පිළිමයි. මෙම මුද්‍රාව මගින් බුදුන් වහන්සේගේ මහා කරුණාව හා මහා ප්‍රඥාව මූර්තිමත් කෙරේ.


### 2. ධර්ම චක්‍ර මුද්‍රාව

බුදුන් වහන්සේගේ ධර්ම දේශනා විලාශය සංකේතවත් කරයි. දකුණු අත්ල පිටතට හරවා පපුවේ මට්ටමට තබාගෙන එහි දබරැඟිල්ලෙන් හා මහපටැඟිල්ලේ තුඩු දෙක කවයක් සෑදෙන සේ එකට තබා ඇතුළට හැරුණු වම් අතේ

# බුදු පිළිමවල දක්නට







ඇඟිල්ලක් ස්පර්ශ කරන ආකාරය මෙහි ප්‍රධාන ලක්ෂණය වේ. මෙම මුද්‍රාවෙන් බුදුන් වහන්සේගේ ධම්මචක්කපවත්වන සූත්‍රය දේශනාව නිරූපණය වන බව පිළිගැනේ.

### 3. අභය මුද්‍රාව

දකුණු අත උඩට නවා, ඇඟිලි සම්පූර්ණයෙන්ම දිගහැර අත්ල ඉදිරිපත්ව සිටින සේ විවෘතව තැබීම අභය මුද්‍රාව සාමාන්‍ය ලක්ෂණයයි. ඇඟිලි සම්පූර්ණයෙන්ම දිග හැරුණු නැති අවස්ථාද පිළිමවල මඳ වශයෙන් දක්නට ලැබේ. අත උඩට ඔසවා අත්ල හරහට සිටින සේ නිමවූ පිළිමද දක්නට ලැබේ. මෙය ධර්ම දේශනා ඉරියව්ව සංකේතවත් කරයි. මෙහි අර්ථය වන්නේ නිර්භයත්වය හෝ අභය දීමය.

### 4. විතර්ක මුද්‍රාව

අත්ල පපු පෙදෙසට ප්‍රමාණවත් පරිදි දකුණු අත උඩට නමා දබර ඇඟිල්ල මාපට ඇඟිල්ල උඩට කවයක් ඇතිවන ආකාරයට තබා සිටීම මෙහි ලක්ෂණය වේ.

එසේම අත්ල ඉදිරිපසට විවෘතව ඉතිරි ඇඟිලි තුන දිගහැර තිබීමද මෙහි ලක්ෂණයකි.

සමහර අවස්ථාවල දබරැඟිල්ල වෙනුවට මැදැඟිල්ල නමා තිබීම දක්නට ලැබේ. බුදුරදුන් විවිධ පුද්ගලයන් සමග වාද විවාද පැවැත්වූ අවස්ථා මෙයින් සංකේත කරයි.

### 5. භූමි ස්පර්ශ මුද්‍රාව

භූමි ස්පර්ශ යන වචනයේ අරුත පොළව ස්පර්ශ කිරීම යන්නයි. හිඳි පිළිමවල පමණක් මෙය දක්නට ලැබේ.

දකුණු අත දකුණු දණහිස උඩින් අත්ල ඇතුළතට සිටින සේ සියලු ඇඟිලි දිග හැර පහතට යොමුව තිබීම මෙහි ලක්ෂණයයි. වම් අත උකුල මත අත්ල උඩින් සිටින අයුරින් තිබේ.

බුදු සිරිත හා බැඳුණු මාර පරාජයේදී බුදුන් වහන්සේ මිහිකත වෙත අත දිගු කොට සාක්ෂ්‍ය එළ වූ අයුරු මෙයින් නිරූපණය වේ යන්න සම්ප්‍රදායික පිළිග ැනීමයි.

### 6. වරද මුද්‍රාව

දකුණ අත පහත් කොට ඉදිරියට දිගහැර අත්ල ඉදිරියට හරවා ඇඟිලි දිගහැර තිබීම මෙම මුද්‍රාවේ ලක්ෂණයයි. මෙය හිටි පිළිමවල බෙහෙවින් දක්නට ලැබේ.


ශ්‍රී ලාංකික බුදු පිළිම අතර වරද මුද්‍රාව දක්නට නොලැබෙන බව වියත් මතය වුවද ගඩලාදෙණි විහාරයේ ඇති ලෝකඩ බුද්ධ ප්‍රතිමාවේ වම් අත දක්වෙන්නේ වරද මුද්‍රාවෙනි. තවද වරද මුද්‍රාව සහිත ලෝකඩ බෝධිසත්ව ප්‍රතිමා කිහිපයක්ද ලංකාවේ නිර්මාණ ලෙස හමුවී ඇත.

සමස්ත ලෝකවාසී බෞද්ධ ජනතාවගේ එකම පරම ශාස්ත්‍රවරයාණන් වන අප මහා ගෞතම බුදුරජාණන් වහන්සේ වන්දනාමාන කිරීමටත්, එමගින් පහන් සංවේගය අප සිත් තුළ ජනිත කරගැනීමටත් එමගින් කුසලයෙහි සිත පිහිටුවා ගැනීමටත් යන කරුණු කාරණා සියල්ලටම බුදු පිළිමය යන සංකල්පය බෙහෙවින් ඉවහල් වී ඇතැයි කිව හැකිය. ඉහතින් දක්වූ විවිධ මුද්‍රාවන් ආදිය මගින් තව තවත් පෘථග්ජන සිත තුළ ශ්‍රද්ධාව ජනිත කරවීමට සමත් වී ඇති බව පෙනේ.

**ප්‍රකාශ් සංදීප්**
**ශ්‍රී දංෂ්ට්‍රා ධාතු මන්දිරයේ,**
**සිරි දළදා දහම් පාසල,**
**මහනුවර.**

# ලැබෙන මුද්‍රා

"සත්පුරුෂයන්ගේ උපදෙස් අනුව වැඩ කරන්නෝ දියුණුවට පත්වෙති චුල්ලසෙට්ඨි ජාතකය"



# දන් දීමෙහි අනුහස් කියැවෙන
# විසල්හ ජාතකය

සකලගුණනිධාන වූ දෙතිස්මහා පුරුෂ ලකුණෙන් හෙබියා වූ, අප තිලෝගුරු සර්වඥයන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරන සමයෙහි අනේපිඬු සිටාණන් අරභයා මෙම ජාතක කතාව දේශනා කොට වදාළ සේක.

ඛදිරාඞ්ගාර ජාතකයෙහි විස්තර වශයෙන් දක්වා ඇති පරිදි අනේපිඬු සිටාණන් විහාරාරාම උදෙසා සූපණස්කෙළක් ධනය වැය කොට විහාරාරාම කරවීය. ත්‍රිවිධ රත්නයේ සරණ හැර අන් සරණක් නොගියේය. සර්වඥ ශාසනයෙහි ඇලී දවසට තුන් වරක් උපස්ථානයට විහාරයට ගියේය. උදෑසන එක් වරෙකි. දහවල් එක් වරෙකි. සවස් වේලෙහි එක් වරෙකි. ඒ අතරතුරෙහිද උපස්ථානයට යෙති. මෙසේ යන විට සාමණේර ළදරු භික්ෂූන් වහන්සේට කිසියම් හෝ දෙයක් රැගෙන යාම සිරිත විය. උදෑසන යනවිට අවුළුපත් ගෙන යයි. වැළඳූ පසු ගිළියේ නම් ගිතෙල්, උක්සකුරු ආදිය ගෙන යයි. මෙසේ දවසක් පාසා පරිත්‍යාග කළ වස්තු ප්‍රමාණයක් නැත. සිටාණන්ගේ නිවසේ පන්සියයක් භික්ෂූන්ට නිතර දනය සපයයි. ඔහුගේ නිවසට බුදුරජාණන් වැඩි සේක. අසූමහසව්වන්ද සෙසු භික්ෂූන් වහන්සේද වැඩි සේක.

මේ සිටාණන්ගේ ගෙය සත් මහලකින් හා දොරටු සතකින් යුක්ත විය. එහි සතරවන දොරටුවේ එක් මිත්‍යාදෘෂ්ටික දෙවිදුවක් අරක්ගෙන සිටියාය. සර්වඥයන් වහන්සේ හෝ ශ්‍රාවකයන් වහන්සේ වඩින කල ඇයට එහි සිටිය නොහැකිව දරුවන් රැගෙන බිමට බැස සිටින්නට සිදුවිය. මේ නිසා ඇය තුළ දන් දීම ගැන කෝපයක් ඇති විය. මේ නිසා සිටාණන් දන්දීම ඇය නොරිස්සුවාය. එසේම සිටාණන් තුළ දන්දීමට ඇති කැමැත්ත නැති කිරීමට වෑයම් කළාය. එහෙත් අන්ත දිළිඳු තත්ත්වයට වැටී වුවද සිටුතුමා දන්දීමේ ප්‍රතිපත්තිය කඩ නොකළේය. දිළිඳු බවට පත්වී නමුත් දන්දීමේ කැමැත්ත ඇතිව

''මරුවාගෙන් පහර ලද්දහුගේ රැකවරණය පිණිස එන දරුවෝත් නැත. මවුපියෝත් නැත. නෑයෝත් නැත. නෑදෑ ආදී කිසිවකුට ඔහු බේරාගත නොහැක.''

දන්දීමෙහිම ඇලී සිටියේය. ශීලයෙහිම පිහිටා සිටියේය. දිනක් මේ දේවතාදුව මේ බව දැක සිටාණන්ට කතා කොට මෙසේ දන්දීමෙන් හා වෙළෙඳාමෙහි නොයෙදීමෙන් දිළිඳු බවට පත්වීමෙන් වන ධන හානිය ගැන පවසා එයින් සිටුවරයා වළකාලන අදහසින් කටයුතු කළත්, සිටුතුමා ඇගේ වචන ප්‍රතික්ෂේප කොට දේවතාදුව එම විමානයෙන් එළවා ගත් තැනේදී ඇය, ශක්‍ර දේවේන්ද්‍රයාගේ උපදෙසින් ක්ෂමාව අයැද සිටු පුත්‍රයාට ණයකරුවන්ගෙන් අයවීමට තිබූ අටළොස්කෙළක් ණය අරගෙන දෙන ලෙස ගිවිස්මා එසේ ණයකරුවන්ගෙන් ණය ලබා දී නැවත දනය ලබාදීමට අවස්ථාව සලසා දීමට කටයුතු යොදා, සිටුතුමාට පෙර පරිදි දන්දීමෙහි නියුක්ත වීමට අවස්ථාව සලසා දුන් අයුරු ඛදිරාඞ්ගාර ජාතකයෙන් පැහැදිලි කොට දක්වා මෙම වර්තමාන කතාව හා සමග අතීත කතාව දේශනා කොට දක්වා වදාළ සේක.

බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකුන් රාජ්‍යය කරන සමයෙහි බෝසතාණන් වහන්සේ **විසල්හ** නම් සිටුවරයා වශයෙන් උපන්නාහුය. එතුමා දන්හල් කරවා දවසට ලක්ෂ හයක් ධන වියදම් කොට මහා දන සම්භාරයක් දන් දුන්නේය. මේ කුසලයෙහි ආනුභාවයෙන් ශක්‍රයාගේ පාණ්ඩුකම්බල ශෛලාසනය උණු විය. එවිට ශක්‍රයා දිවැසින් බලා ශක්‍ර සම්පත්තිය ඇරගැනීම උදෙසා මේ දන්දීම කරතැයි සැක කොට එම දනයට බාධා කිරීමට සිතා අවුත් සිටාණන් දන් දෙන්නට පිළියෙළ කර තැබූ එළඟි තෙල්, සහල්, තල, මුං ආදී වූ දෙයක් රත්‍රං, මුතු, මැණික් ආදී වූ දෙයක් යන සියලු වස්තු අන්තර්දහන කළේය.

සිටාණන්ගේ දන් දීම භාර දී තිබූ පුරුෂයා සලක්ෂයක් ධන වියදම් කොට දන් දෙන්නට තිබූ සියලු වස්තුව අතුරුදහන්ව ඇති බව දැක ඒ බව සිටාණන්ට දැන්වීය. දන් දෙන්නට තිබූ සියලු වස්තුව අන්තර්දහන විය. එනිසා හෙට දන් දෙන්නට කිසි දෙයක් නැතැයි කීහ. එපවත් අසා සිටාණෝ, ඊට කාරණය කුමක්දැයි සිතා ස්වකීය බිරිඳ ගෙන්වා, හෙට දන්දීමට තිබෙන සියලු වස්තුව නැතිව ඇති බව දන්වා මගේ රත්‍රං, මුතු, මැණික් ආදිය ඇති භාණ්ඩාගාර අරවා, ඒවා වියදම් කොට දන් දෙන්නට පිළියෙළ කරන්නැයි දැන්වූ කල්හි, ඕ තොමෝ භාණ්ඩාගාරය ඇර බැලූ විට සියලු වස්තුව අතුරුදහන්ව ඇති බව දැක, ඔබතුමාගේත්, මාගේත් සලුව ඇර අන් සියල්ල අන්තර්දහන් වී ඇතැයි දන්වා සිටියාය. එවිට සිටාණෝ මගේ ප්‍රාණය තිබෙන තෙක් දනයට අන්තරා කළ නොහැක. ගෙයි දන් දෙන්නට කිසි දෙයක් නොමැති තැන ගෙහි කදකුත්, දෑ කැත්තකුත් තිබෙනු දැක, එය ගෙනැවිත් දුන් විට සිටුතුමා කදත්, දෑකැත්තත් ගෙන තණ කපාගෙන විකුණා භාගයක් දන් දී භාගයක් රැකීමට ගනිමියි සිතා වනයට ගියේය. තමන්ට තිබූ භාගයද යාචකයන් පැමිණි කල්හි බෙදා දී සිටාණන් සය දවසක් නිරාහාරව සිටියේය. සත්වන දවසේ තණ කද කර තබාගෙන ගෙට එන දවසේ අව් රශ්මියෙන් මැළවී ගිය ශරීරය ඇතිව ක්ලාන්තය ඇති වී වීදියෙහි ඇද වැටුණාහ.

එවිට ශක්‍රයා ආකාශයේ සිට කියන්නාහු, එම්බල සිටාණෙනි, තොප දුප්පත් අවස්ථාවේ ප්‍රාණය රැක නොගෙන දන් නොදී සැපසේ සිටින්නැයි අවවාද කළ කල්හි, ඔබ කවුදැයි ඇසූ විට, මම ශක්‍රයා වෙමියි කීවේය. එවිට සිටාණන් තොප මේ සා ශක්‍ර සම්පත් ලැබුවේ දන් දී, පෝය අෂ්ඨාංග



ශීලය රැක වුවද, මෙසේ පින් කොට ශක්‍ර සම්පත්තිය ලබා සිටින්නේත් මට මෙසේ කීමට එක් ශක්‍රයෙක් නොව ශක්‍රයන් කීප දෙනෙක් වුවද මාගේ දන්දීම නතර නොකරමි. මගේ දනයට අන්තරා නොකරන්නැයි ඉල්ලීය. මෙසේ දුක්ඛිතව සිටිද්දීත් දනධ්‍යාශයට අඩුවක් නොකරන්නැයි ඉල්ලා සිටි විට, ශක්‍රයා දුකට පත්ව, ඔබ දුක්ඛිතව සිටියදීත් මෙසේ දනයට අඩුවක් නොකරන්නැයි ඉල්ලා සිටින්නේ කවර කරුණක් නිසාදැයි ඇසුවේය.

මම දන්දීමෙන් ශක්‍ර සම්පත් බලාපොරොත්තුවක් නැත. බ්‍රහ්ම සම්පත් අරගැනීම සඳහා මෙසේ දන් නොදෙමි. ඔබ ඇතුළු සූවිසි සංඛ්‍යාත සතුන් සංසාර සාගරයෙන් ගොඩලා සම්‍යක් සම්බෝධියට පැමිණවීමට දන් දෙමියි කීහ. එපවත් අසා ශක්‍රයා සතුටට පත්ව, ශක්‍රයාගේ සිරුර තමාගේ අතින් පිරිමැද ඔබ මෙතෙක් දුන්නේ සලක්ෂයක් වුවද, මින් ඉදිරියට දෙළොස් ලක්ෂයක් දන් දෙන්නැයි කියා, අන්තර්දහන් කළ සියලු ධනය පුරවා නැවත වරක් ශක්‍ර භවනයට ගියේය. මෙසේ විසල්හ සිටුවරයා වශයෙන් උපන්නේ බුදුන් වහන්සේ බව දන්වා මෙම ජාතක කතාව නිමවා වදාළ සේක.

මෙම විසල්හ ජාතකයෙන් විස්තර වන පරිදි දන් දීමෙහි අනුසස් මැනවින් අවබෝධ කරගෙන අපිදු අනලස්ව දන්දීමෙහි නිරතව උභය ලෝකාර්ථ සිද්ධිය සාධනය කර ගැනීමට අදිටන් කරගනිමු.

**කේ. මීගහකුඹුර**

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."

# අස්ගිරි මාහිමිපාණන් ප්‍රධාන එකොළොස් නමක් අස්ගිරි මහා විහාරයේ වස් එළඹෙති



මහනුවර අස්ගිරිය ඓතිහාසික උපෝසථාගාරයේදී අස්ගිරිය මහා විහාර පාර්ශ්වයේ අති ගෞරවාර්හ ගලගම අත්ථදස්සි මාහිමිපාණන් වෙත මහනුවර රජපිහිල්ල මාවතේ ලයනල් ගුණතිලක මහතා දෑහැත් ගොටුව පිරිනමා වස් ආරාධනා කළ අයුරු.

**අස්ගිරි** මහා විහාර පාර්ශ්වයේ අති ගෞරවාර්හ මහානායක ඓතිහාසික මහියංගන රජමහ විහාරාධිපති ගලගම ශ්‍රී අර්ථදස්සි මාහිමිපාණන් වහන්සේ ප්‍රධාන මහා සංඝයා වහන්සේලා එකොළොස් නමක් අස්ගිරිය මහා විහාරයේ වස් එළඹෙති.

අස්ගිරිය මහා විහාරයීය ඓතිහාසික උපෝසථාගාරයේදී අස්ගිරි මහානායක මාහිමිපාණන් වහන්සේ වෙත මහනුවර රජපිහිල්ල මාවතේ ලයනල් ගුණතිලක මහතා විසින් චාරිත්‍රානුකූලව දෑහැත් ගොටු පිරිනමා වස් වැසීමට ආරාධනා කළ අතර ගුණතිලක මහතා ප්‍රධාන පවුලේ පිරිස හා දයකයින් විසින් සෙසු සංඝයා වහන්සේලාට පිළිවෙළින් දෑහැත් පිරිනමා වස් ආරාධනා කළහ. මෙහිදී ධර්ම දනයක් වශයෙන් ධර්ම පුස්තක පූජාවක්ද පවත්වන ලදී.

වස් ආරාධනා ලැබූ සංඝයා වහන්සේලා මෙසේය.

කාරක සභික අරඹේගම සරණංකර හිමි, කාරක සභික මැදගම ධම්මානන්ද හිමි, කාරක සභික කුඹුක්කැන්වල පුඤ්ඤරතන හිමි, කාරක සභික වඳුරාගල ධම්මාරාම හිමි, කාරක සභික ගල්ලෑල්ලේ සද්ධාතිස්ස හිමි, වෛද්‍ය බෝගමුවේ ඉන්දරතන හිමි, මැණික්හින්නේ රතනසාර හිමි, අඹගස්පිටියේ ධම්මදස්සි හිමි, මන්දුරම් නුවර යසස්සි හිමි.

මහනුවර ශ්‍රී සම්බෝධි විහාරාධිපති, අස්ගිරිය මහා විහාරයේ කර්මාචාර්ය රාවණාඇල්ලේ පඤ්ඤමෝලි හිමිගේ සහභාගිත්වයෙන් පැවැති වස් ආරාධනාවට ලේඛා ගුණතිලක මහත්මිය ඇතුළු රංගන ගුණතිලක, රුක්ෂාන් ගුණතිලක යන මහත්වරු සහ අස්ගිරි මහා විහාරයේ සහ ශ්‍රී සම්බෝධි විහාරයේ දයක දයිකාවන් රැසක් සහභාගි වූහ.

බොදු පුවත්

## ඓතිහාසික බම්බා රජමහ විහාරාධිපති පදවිය මහෝපාධ්‍ය ගොමගොඩ ශ්‍රී රතනසාර හිමිට



**මහනුවර** ශ්‍රී නාථ දේවාල විහාරය, ගැටඹේ ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරය, මැණික්හින්න හීපිටිය පුරාණ විහාත්‍රායාධිපති අස්ගිරිය මහා විහාරයීය විංශත් වර්ගික කාරක මහා සංඝ සභාවේ කාරක සභික, මහෝපාධ්‍ය ගොමගොඩ ශ්‍රී ගුණරතන රතනසාර නාහිමියෝ, ගලේවෙල ඓතිහාසික බම්බා රජමහ විහාරාධිපති පදවියට අස්ගිරිය රජමහ විහාරයීය කාරක මහා සංඝ සභාව විසින් පත්කර ඇත.


අස්ගිරිය මහා විහාරයීය කාරක සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ කාරක සභික පාතදුම්බර ප්‍රධාන සංඝනායක මහෝපාධ්‍ය අපවත් වී වදළ ගොඩමුන්නේ ශ්‍රී ගුණරතන නාහිමිගේ ශිෂ්‍ය රත්නයක් වන ගොමගොඩ රතනසාර නාහිමියෝ අස්ගිරිය මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ලේඛකාධිකාරීව වැඩ සිටි මහාචාර්ය වරකාවේ ධම්මාලෝක හිමියෝ පැවිදි භාවයෙන් සහෝදරයෙකි. අවස්ථා දෙකකදීම ශ්‍රී දළද තේවාව සිදුකළ රතනසාර නාහිමියෝ දළද සමිඳු චාරිත්‍ර චාරිත්‍ර සම්ප්‍රදයන් තේවාව මුල්කරගෙන ලබාගත් අස්ගිරිය මහා සංඝ සභාවේ ජ්‍යෙෂ්ඨ ධර්මධර, සුපේශල ශික්ෂාකාමී මහ තෙර නමකි. වර්ෂ 1971 දී ශ්‍රී දළද සමිඳු තේවාව සිදුකරමින් වසර තිහක් පමණ කර්මාචාර්යයන් වහන්සේ නමක් ලෙස අස්ගිරිය මහා විහාරයේ උපසම්පද විනය කර්ම කටයුතුවල මහා විහාරයේ සම්ප්‍රදයන් ගරු කරමින් ශාසනික කටයුතුවල නිරතව වැඩ සිටිති.

## මහනුවර බූවැලිකඩ ශ්‍රී වර්ධනාරාම විහාරයේ ආදිකර්තෘන් වහන්සේලා සිහිපත් කෙරේ

**මහනුවර** බූවැලිකඩ ශ්‍රී වර්ධනාරාමය, යටිනුවර ඉලුක්වත්ත ශ්‍රී ලංකා බුද්ධගයා මහා විහාරය, මල්වතු මහා විහාරයේ වල්ගොව්වාගොඩ පන්සල යන විහාරයන්හි විහාරාධිපති මහනුවර ශ්‍රී සංඝරාජ මහ පිරිවෙණේ විශ්‍රාමික පරිවෙණාධිපති මල්වතු මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී වල්ගොව්වාගොඩ ශ්‍රී මේධංකර විමල බුද්ධි ස්ථවිරයන් හා ශ්‍රී වර්ධනාරාමාධිකාරී මහනුවර විද්‍යාර්ථ විද්‍යාලයෙහි නියෝජ්‍ය විදුහල්පති ශාස්ත්‍රවේදී නබඩවැවේ පඤ්ඤසාර ස්ථවිරයන් ප්‍රධාන දයක ඥති හිතවතුන් විසින් 2015 ජූලි 30 වැනි දින රාත්‍රී 7.30 ට ශ්‍යාමෝපාලි වංශික මහා නිකායෙහි මල්වතු පාර්ශ්වයෙහි සද්ධම්මජෝතික ධජ සාහිත්‍යය චක්‍රවර්තී ආචාර්ය නියංගොඩ ධර්මකීර්ති ශ්‍රී සංඝරක්ෂිත විජිතසිරි අභිධාන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් ධර්ම දේශනාවක් පවත්වා 31 වැනි දින දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්මාභිධාන අනුනායක හිමියන්, සද්ධම්මජෝතික ධජ අග්ගමහා පණ්ඩිත අලුත්ගම ශ්‍රී ධම්මානන්ද මහා ස්වාමීන්ද්‍රයන් වහන්සේ ප්‍රධාන මහා සංඝරත්නය වෙත සපිරිකර සංඝගත දක්ෂිණාවක් පවත්වා ශ්‍රී වර්ධනාරාමාධිපති, මහනුවර ශ්‍රී සංඝරාජ මහ පිරිවෙණේ විශ්‍රාමික පරිවේණාධිපති මල්වතු මහා විහාරයීය කාරක සංඝ සභික රාජකීය පණ්ඩිත මාබෝපිටියේ ශ්‍රී මේධංකර ස්වාමීන් වහන්සේට, මල්වතු මහා විහාරයීය කාරක මහා සංඝ සභාවේ ප්‍රධාන ලේඛකාධිකාරී ගංගාරාම රජමහ විහාරයේ නායක යටිගම්මන ශ්‍රී මේධංකර විමලඤාණ ස්වාමීන් වහන්සේට, ශ්‍රී වර්ධනාරාමාධිපති ඉසුරුමුණියේ ශ්‍රී සංඝරක්ඛිත ස්වාමීන් වහන්සේට, ශ්‍රී වර්ධනාරාමයේ අවුරුදු 7 ක් පමණ වැඩ සිට අපවත් වී වදළ කටුමුළුවේ ජිනරතන ස්වාමීන් වහන්සේට, ශ්‍රී වර්ධනාරාමාධිපති හිග්ගොඩ ඛේමානන්ද ස්වාමීන් වහන්සේට, ඉළුක්වත්තේ ශ්‍රී සුමන නාහිමියන් වහන්සේට, වල්ගොව්වාගොඩ ජිනරතන ස්වාමීන් වහන්සේට, රදලියගොඩ ශ්‍රී සුමනාභිධාන තිස්සව නාහිමියන්ටද මෙතෙක් මියගිය දයක කාරක ඥති හිත මිත්‍ර සියලු දෙනාටම පින් අනුමෝදන් කෙරේ.

**කේ. බණ්ඩාරනායක**

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# දළදා පෙරහරෙන් පසු පැවැත්වෙන වලියක් මංගල්ලය ගැනයි මේ

මහනුවර ඇසළ උළෙලේ විවිධ අංග රාශියක් වෙයි. කප් සිටුවීම, ගේවට පෙරහර, කුඹල් පෙරහර, රන්දෝලි පෙරහර, දිය කැපීම වලියක් මංගල්‍යය යන අංග ඉන් ප්‍රධාන වේ. කප් සිටුවීමෙන් ඇරඹී මහ විෂ්ණු දේවාලයේ කෙරෙන ''මලියක් මංගල්‍යයෙන්'' ඇසළ උත්සව කටයුතු නිමාවට පත්වේ. ඇසළ උළෙල සම්බන්ධ කටයුතු අතර ශාන්තිකර්මයක් ලෙස වැදගත් තැනක් හිමිවන්නේ වලියක් මංගල්‍යයටය.

ඇසළ පෙරහර සාර්ථක ලෙස කිරීමට දෙවියන්ගේ ආශිර්වාදය අවශ්‍ය යයි විශ්වාසයක් පවතී. එබැවින් පෙරහර අවසානයේදී දෙවියන්ට පින් අනුමෝදන් කරවීමටත්, පෙරහරට සහභාගි වූ සියලුම දෙනාට සෙත් පත් වස් දෙස් දුරු කිරීමටත් යොදගත් ශාන්තිකර්මයක් වන්නේ ''වලියකුන් නැටීම'' හෙවත් ''වලියක් මංගල්‍යයයි.''

වලියක් මංගල්‍යය කොහොඹ යක් කංකාරියේ වෙනස් ආකාරයක් බව ''තිත්තපප්පල ඉලංගම් කරුණාධිපති බ්‍රාහ්මණ ගණිත ගෙදර සුමනවීර මහතා'' පවසයි. (සඳුසර, 2007 මාර්තු) සුමනවීර මහතා තිත්තපජ්ජල නැටුම් පරපුරේ වර්තමානයේ සිටින ජ්‍යෙෂ්ඨයායි. එසේම ඔහු කොහොඹා යක් කංකාරිය පිළිබඳ මෙකල සිටින ප්‍රවීණයායි.

වලියක් මංගල්‍යය පවත්වනු ලබන්නේ මහනුවර මහා විෂ්ණු දේවාලයේයි. එහෙත් අතීතයේදී ගඩලාදෙණිය, අම්බැක්ක හා දෙඩන්වල දේවාලවලද වාර්ෂික පෙරහර නිමවූ පසුව වලියක් මංගල්‍යය පැවැත්වූ බවට සාධක තිබේ.

''වලියක් මංගල්‍යය'' සඳහා විෂ්ණු දේවාලය තෝරාගෙන ඇත්තේ ''වලියකුන්'' විෂ්ණු දෙවියන්ගේ දරුවන් යයි විශ්වාසයක් පවතින බැවිනි. කොහොඹා කංකාරියේ සහ දෙවියන්ගෙන් ඉතාම බලසම්පන්න දෙවියන් තිදෙනා වලියකුන් තිදෙනාය. වලියක් උපතේ මෙසේ සඳහන් වේ.

'වනයේ උපන් නෙමු
පුල්වන් රජුට ද වෙමු
සත් වන් දෙබෑ වෙමු
අසුර සෙනඟට පසු නොබෑ වෙමු'

මෙහි සඳහන් වන පරිදි මොවුන් උපුල්වන් හෙවත් විෂ්ණු දෙවියන්ගේ දරුවන්ය. දේව කතාවල එන විස්තර අනුව වලියක් උපත සිදුවී ඇත්තේ මෙසේය.

දිනක් උපුල්වන් දෙව් වනයේ හැසිරෙද්දී එහි විල් තෙරකදී ''සීතාපති'' නම් රූමත් දෙවඟනක් හමුවිය. ඇය සිය වසඟයට ගත් උපුල්වන් දෙව් ඈ සිය භවනයට කැඳවාගෙන ආවා්ය. ඔවුන්ගේ ඇසුර නිසා කල් යාමේදී ''සීතාපති'' ගැබ් ගත්තාය එහෙත් ඇය පිළිබඳව සැක ඉපිද වූ උපුල්වන් ඇය කැලයට ගෙන ගොස් මරා දමන ලෙස සිය මලනුවන්ට නියම කළේය. ඇය කැලයට ගෙන ගිය උපුල්වන්ගේ සොහොයුරා ඇය කෙරෙහි අනුකම්පා කොට ඇයට ජීවිත දනය දී කැලයේ ඈතට ගොස් ජීවත් වන ලෙස පවසා ආපසු ආවේය.

මහ වනයේ තනි වූ ''සීතාපති'' ට ''නාගපට්ඨ'' නම් සෘෂිවරයකු මුණ ගැසී ඇය සිය අසපුවේ රඳවා ගත්තාය. මඳ කලකින් ඕ පුත් කුමරෙකු වැදුවාය. ඔහුට ''සඳලිඳු'' යයි නම් තබන ලදී. දිනක් සීතාපති පළ කුල නෙළීමට අසපුවෙන් බැහැර ගිය විට ''සඳලිඳු'' දක්නට නොවීය. ඔහු නැතිවී යයි බියට පත් ''නාගපට්ඨ සෘෂි'' මහනෙල් මලක් ගෙන එවැනිම කුමරෙකු මැවීය. ''සීතාපති'' ආපසු පැමිණි කල මෙතෙක් සැඟවී සිටි ''සඳලිඳු'' ද ආපසු ආවේය. එක සමාන දරුවන් දෙදෙනා දුටු සීතාපති පුදුම වී ඒ ගැන විමසූ විට සිදුවූ සියල්ල සෘෂිවරයා විසින් විස්තර කරන ලදී.

එහෙත් සීතාපති හට එය අවබෝධ කරවීම අපහසු වූ බැවින් ඊතණ මිටක් ගෙන තවත් දරුවකු මවා පෙන්වීමට සෘෂිවරයාට සිදුවිය. අනතුරුව කුමරුවන් තිදෙනාම සීතාපතිගේ සෙනෙහස

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"

ලබමින් වනයේම වැඩුණි. මෙයින් මලෙන් උපන් කුමරු ''මලේ කුමරු'' යනුවෙන්ද, ඊතණ මිටෙන් උපන් කුමරා කස්ත්‍රිය කුමරු යනුවෙන්ද හැඳින්වූහ.


දිනක් වනයේ ඇවිදිමින් සිටි මෙම කුමාරවරු තිදෙනාට අඹ කඩමින් සිටි ''පත්තිනි දේවිය'' හා ''පාලඟ'' කුමරු මුණ ගැසුණි. පාලඟ කුමරු ගසට නැග කෙක්කකින් අඹ කැඩූ අතර පත්තිනි දේවිය බිම සිට කෙක්කකින් අඹ කැඩුවාය. එක් මොහොතක දෙදෙනාගේ කෙකි දෙක එකට ඇමිනුණි. පත්තිනිය සිය කෙක්ක ඇද්ද නමුත් ඇදගත නොහැකි විය. පුළුවන් නම් එය ඇදගන්නා ලෙස කියමින් පාලඟ කුමරු පත්තිනියට විහිළු කළේය. ලජ්ජාවට පත් පත්තිනි දේවිය වටපිට බලන විට එතැනට පැමිණ සිටි ''සඳලිඳු'', ''මලමී'' සහ ''කාස්ත්‍රිය'' කුමාරවරු දුටුවාය.

පත්තිනියට ඔවුන්ට කතා කොට සිය කෙක්ක ඇද දෙන ලෙස ඉල්ලා සිටියාය. කුමාරවරු තිදෙනා පැමිණ එක වලියටම කෙක්ක ඇද්දෝය. පාලඟගේ කෙක්ක කැඩී ගියේය. මෙයින් විශ්මයට පත් පත්තින් දේවිය ''මලියට යකුන්'' යැයි කියා කුමාරවරු තිදෙනාට වරම් දෙවා බලසම්පන්න දේව ගණයට ඇතුළත් කළ බව යාතිකාවල දැක්වේ. ''අං කෙළිය'' පවත්වනුයේ මෙම සිද්ධිය සිහිපත් වීමට බව මතයකි.

මෙහි සඳහන් උපුල්වන් සීතාපති හා උපුල්වන් මළණුවන් ''රාම'' ''සීතා'' සහ ලක්ෂ්මණ යයිද ඇතැමෙකුගේ මතය වෙති.

වලියක් මංගල්‍යයේදී කෙරෙන නැටුම් සාමාන්‍යයෙන් පෙරහරේදී කෙරෙන නැටුම්වලට වඩා ශාස්ත්‍රීය වේ. එසේම මෙම වලියක් මංගල්‍යයටම විශේෂ නැටුම්ද ඇත. මෙහි ඇති තවත් විශේෂයක් නම් පෙරහරේදී නැටුම් දක්වන නැට්ටුවන් මෙම ශාන්තිකර්මයට සහභාගි නොවීමය. වලියක් මංගල්‍යය කරන්නා සිංහල රජ දවස සිටම මෙම කටයුත්ත සඳහා ගම්වර ලබා සිටින්නේ මාවනැල්ලේ අලුත්නුවර දේවාලය අසල පදිංචි ප්‍රසිද්ධ නාට්‍ය පරපුරක නැට්ටුවන් විසිනි. එම පරම්පරාව දෙවනගල නාට්‍ය පරපුරයි. එහි වර්තමාන ප්‍රධානියා වන්නේ සයිමන් ගුරුන්නාන්සේය. ඔවුන්ට පැවැරී ඇති රාජකාරිය පෙරහර අවසානයේ වලියක් මංගල්‍යය නැටීමය.

**විජේරත්න අතුරුපාන**



# බුදු ගුණ භාවනාව

(භාවනා කිරීමේදී පවුලේ සියලු දෙනාම එකතු වන්න.)

| | |
|---|---|
| දුක්ඛෙ ඤාණං බුද්ධ | ඤාණං |
| දුක්ඛ සමුදයේ ඤාණං බුද්ධ | ඤාණං |
| දුක්ඛ නිරෝධෙ ඤාණං බුද්ධ | ඤාණං |
| අටවිසි බුදුගුණ බලයෙන් ගෙදර සැමට | ජයවේවා |
| අටවිසි බුදුගුණ බලයෙන් පවුලේ සැමට | ජයවේවා |
| අටවිසි බුදුගුණ බලයෙන් අප සැමට | ජයවේවා |
| අටවිසි බුදුගුණ බලයෙන් බුදු පිරිසට | ජයවේවා |
| සත්ත බුද්ධ ගුණ බලයෙන් සැම ග්‍රහ දොස් | දුරුවේවා |
| සත්ත බෝධි අංග බෙලෙන් සියලු රෝග | සුවවේවා |
| බුද්ධ රශ්මි මාලාවෙන් අණවින දොස් | ඉගිලේවා |
| බෝධි සත්ව ගුණ බලයෙන් සුවසෙත නිති | ළංවේවා |
| බුද්ධ රත්නෙ බුදු බලයෙන් සියලු රෝග | සුවවේවා |
| ධම්ම රත්නෙ ධර්ම බලෙන් සියලු රෝග | සුවවේවා |
| සංඝ රත්නෙ ගුණ බලයෙන් සියලු රෝග | සුවවේවා |
| ත්‍රිවිධ රත්නෙ ගුණ බලයෙන් සියලු රෝග | සුවවේවා |
| බෝ සමිඳුන්ට ඒකවරණය දෙන | දෙවිඳේ |
| මම දෙන පින් අනුමෝදන් වී | නිබඳේ |
| පෙර පව් බලෙන් ඇතිවුණ කරදර | සැමදේ |
| දුරුකරවා දෙනු නවග්‍රහ පල | සමිඳේ |
| මා කරනා පින් දෙවිඳුට | අත්වේවා |
| දෙවියන් පතන බෝධියකට | පැමිණේවා |
| අප හට ඇති අපල උවදුරු | මගහරවා |
| දෙන්ට දෙවිඳුට වැඳ වැඳ | පවසනවා |
| මා පතනා පැතුම් ඉටුකරවා | දෙන්න |
| දිවනෙත් යොමා මා හට පිහිටක් | වන්න |
| මා කියනා දෙයට දිව නෙත් කන් | යොමුවන්න |
| දෙවිඳුන් පින් ගන්න දෙවිඳුනි පින් | ගන්න |
| නව ග්‍රහ මණ්ඩලය මම දෙන පින් ලැබ | ගන්න |
| යෙදිලා තියෙන අපලය දුරු කර | දෙන්න |
| කරදර කම්කටොළු මග හරවා | දෙන්න |
| දුක් කරදර දුරු කරවා දී සහනය | සලසන්න |

# තෙරුවන් ගුණ භාවනාව

නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

බුදුගුණ අනන්තයි, සදහම් ගුණ අනන්තයි, මහා සඟ ගුණ අනන්තයි, අනන්ත බුදුගුණ බලයෙන්ද, අනන්ත සදහම් ගුණ බලයෙන්ද, අනන්ත මහා සඟ ගුණ බලයෙන්ද, අනන්ත මව්පිය ගුරු බලයෙන්ද, අනන්ත බෝසත් ගුණ බලයෙන්ද, අනන්ත ආර්ය දිව්‍යරාජ ගුණ බලයෙන්ද, අනන්ත බ්‍රහ්ම රාජ ගුණ බලයෙන්ද, මාගේ ශීලාදී ගුණ බලයෙන්ද, මම නිදුක් වෙම්වා, නිරෝගී වෙම්වා, සුවපත් වෙම්වා, මා මෙන්ම මාගේ පවුලේ සියලු දෙනාද, මව්පිය ගුරුදෙගුරු උතුමෝද, කල්‍යාණ මිතුරෝද, හිතවත්තයෝද, මැදහත් වූවෝද, සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා, ආයුෂයෙන් වැඩෙත්වා, වර්ණයෙන් වැඩෙත්වා, සැපයෙන් වැඩෙත්වා, කාය බලයෙන් වැඩෙත්වා, ඥාන බලයෙන් වැඩෙත්වා, සුවසේ නින්ද යත්වා, සුවසේ පිබිදෙත්වා, දෙව් මිනිසුන්ට ප්‍රියවෙත්වා, දෙව් බඹුන්ගේ ආරක්ෂාව ලබත්වා, ගුණයෙන් නුවණින් වැඩෙත්වා, ධනයෙන් ධාන්‍යයෙන් වැඩෙත්වා, යස ඉසුරන්ගෙන් වැඩෙත්වා, සැපතින් සම්පතින් වැඩෙත්වා, හිරිඔතප් ගුණයෙන් වැඩෙත්වා, ශ්‍රද්ධාවෙන් ශීල ගුණයෙන් වැඩෙත්වා, ශ්‍රැතයෙන් ත්‍යාගයෙන් වැඩෙත්වා, ඥානයෙන් අවබෝධයෙන් වැඩෙත්වා, සාමයෙන් සමාදානයෙන් වැඩෙත්වා, ශාන්තියෙන් ඉවසීමෙන් වැඩෙත්වා, සැනසුම සුවයෙන් වැඩෙත්වා, මෛත්‍රියෙන් කරුණාවෙන් වැඩෙත්වා, මුදිතාවෙන් උපේක්ෂාවෙන් වැඩෙත්වා, සමථ විදසුන් නුවණින් වැඩෙත්වා, සියවස් කලක් දීර්ඝායුෂ වළඳත්වා, දෙව්ලොව සුබසෙත ලබත්වා, මමද පවුලේ සියලු දෙනාද, සියලු සත්ත්වයෝද නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා... සුවපත් වෙත්වා... දුකෙන් මිදෙත්වා... සුමිහිරි නිවන් සැපතින් සුවපත් වෙත්වා... සාදු, සාදු, සාදු.



"විමසිලිමත්බව ඔබේත්, රටේත් ආරක්ෂාවයි"